2026.07.12 ඉරිදා | හත්වැනි කාණ්ඩය | 51 වැනි කලාපය
දැන් ඉරිදා

# මව්බිම

රු.100

උපුල් ජෝෂප් ප්‍රනාන්දුගේ
ගුරුද විග්‍රහය

සජිත්ට අතට අතදී අනුර යන්න යයි
P » 09

මීගමු හිරගෙදර ප්‍රහාරය ගැන
විශේෂ හෙළිදරව්වක්
P » 02

මුලින්ම දාන්නේ කාටද?

# නිවාස අඩස්සිය සූදානම්

කකුලට දාන විද්‍යුත් වළල්ලක් එනවා

මීගමුව බන්ධනාගාරය තුළ සිදුවූ ඛේදජනක සිදුවීමෙන් අනතුරුව බන්ධනාගාරවල තදබදය අවම කිරීම සඳහා 'නිවාස අඩස්සි' ක්‍රමය හඳුන්වා දීමට ආණ්ඩුව සූදානමින් සිටින බව වාර්තා වේ. ඒ අනුව මේ වනවිට නිවාස අඩස්සි ක්‍රමය පිළිබඳ සොයා බැලීම සඳහා ඉහළ පෙළේ කමිටුවක් පත්කර ඇති බවද දැනගන්නට ඇත. මෙම ක්‍රමය යටතේ රැඳවියන් රිමාන්ඩ් බන්ධනාගාරගත කරනවා වෙනුවට සිය නිවසේම රඳවා තැබීමට යෝජනා වී ඇති අතර...
P » 02

විනිසුරු කාලය දීර්ඝ කිරීම

# මුළු විපක්ෂයම එකතු කරන්න නාමල් සජිත්ට ලියුමක් ලියයි
P » 03

සජිත්ට පාර්ලිමේන්තුවේ තහනමක්
P » 02

ඇමෙරිකාවේ ඉන්න

## රාජපක්ෂ කෙනෙක් ලංකාවට ඉල්ලයි

මේ වනවිට ඇමෙරිකාවේ වාසය කරන ප්‍රබල රාජපක්ෂවරයකු සිය රටට ලබාදෙන ලෙස ඉල්ලා ඇමෙරිකානු අධිකරණ දෙපාර්තමේන්තුව වෙත ලංකාව පාර්ශ්වයෙන් ලිපි කිහිපයක් යොමුවී ඇති බව වාර්තා වේ.
P » 02

## අධිකරණ ඇමැති හර්ෂණට විශ්වාසභංගයක්

අධිකරණ අමාත්‍ය හර්ෂණ නානායක්කාර මහතාට එරෙහිව විපක්ෂය විසින්විශ්වාසභංග යෝජනාවක් අස්සන් කර තිබේ. පසුගියදා මීගමුව බන්ධනාගාරය තුළ සිදුවූ නොසන්සුන්තාව නිසා
P » 02

18 වැනිදා

## විනිසුරු මහ සමුළුව තීරණාත්මකයි
P » 02

## 'අමරපුර' උපසම්පදාවේදී ජනාධිපති කතා නොකළේ ඇයි?
P » 02

## අමරේ මම මහින්ද

මෙන්න ඇත්ත කතාව
P » 12

විජය ගාමිණී මාලනී

මුදලාලි කෙනෙකුට චෝදනාවක්

## චරිත විනාශ කරන්න එපා
P » 02

## විජේ-ගජේන්ද්‍රන් කතා කළ බරපතළ කරුණු හෙළිවේ
P » 02




# සුනාමිය වෙලාවේ ගාලු ස්ටෑන්ඩ් එකේ බස් එකේ එල්ලිලා හිටපු ගෑනු ළමයි ටික මතකද?



## එදා අවුරුදු 21ක් වෙච්ච ඒ ළමයට අද අවුරුදු 42ක්

# ආයෙත් රැල්ලක් එයිද?

**එදා දවසටත් වෙනදා වගේම හිරු උදාවුණා. වෙරළට ආදරය කළ මිනිස්සු මුහුදු දිහා බලාගෙන සිනාසුණා. පෝය දවසෙ නිවාඩු නිසා බොහෝ දෙනෙක් විනෝද ගමන් ගියා. කුඩා දරුවන් වෙරළේ වැලි මාලිගා හැදුවා. කවුරුත් හිතුවේ නැහැ තවත් මිනිත්තු කිහිපයකින් ඒ මුහුදම මරණයේ නිහඬ දූතයෙක් වෙයි කියලා. ඒත් උදෑසන 9.26ට ලෝකයම වෙනස් වුණා.**

මුහුදු රළ පහර අරගෙන යන්න ආවේ වතුර විතරක් නෙවෙයි, දහස් ගණනක් ජීවිතවල සිහිනව ජීවිතවල අනාගතයක් අරගෙන ගියා. අදට වසර 21ක් ගෙවී ගියත් සුනාමිය ඉවරවෙලා නැහැ. ඒ අභියෝග ආදරණීයන්ගේ හිත්වල අදත් තිගැස්මක් කම්පනයක් තියෙනවා. ඒ මහා ඛේදවාචකයෙන් දිවි බේරාගත් සන්ධ්‍යාගේ හදවත තුළත් ඒ කම්පනය තවමත් රැඳී පවතිනවා.

ඇය කියනවා මම වතුර යටට ගියා, හුස්ම ගන්නවත් බැහැ, මට හිතුණේ මේ තමයි මගේ අවසානය කියලා. ඒත් මට තාත්තා මතක් වුණා කියලා. ඇය අල්ලගෙන තිබුණේ ලැල්ලක් කියලා හිතුව දෙයක්. පස්සේ දැනගත්තේ වතුරෙන් යටවුණු බස් රථයක වහලය කියලා. සන්ධ්‍යාගේ තාත්තා තමන්ගේ දුවව සොයන්න බස් නැවතුම්පොළේ පාරවල් දිගේ, රෝහල් කොරිඩෝවල ගියා. සුදු රෙදිවලින් වසා තිබුණු මළ සිරුරු අතර 'මගේ දුව නැහැ නේද' ඒ ප්‍රශ්නය ඔහුගේ හදවත කඩා බිඳ දැම්මා.

ඒ දවස්වල ස්වර්ණවාහිනී රූපවාහිනී සේවයේ ගාල්ල ප්‍රාදේශීය වාර්තාකරුවකු ලෙස සේවය කළේ අජන්ත සමරවික්‍රම මහතායි. ඔහු එදා ගාල්ල බස් නැවතුම්පොළේ සහ ගාල්ල නගරයේ දර්ශන කැමරාවට හසුකරගෙන තිබුණා. ඒ දර්ශනවල බස් නැවතුම්පොළේ සිටි ගැහැනු ළමයි කිහිප දෙනෙක් මේ දරුණු සුනාමි රළ පෙළ විසින් බිලිගන්නා ආකාරය වගේම ඒ රළ පහරට හසුව ගසාගෙන ගිය බස් රථයකට ගොඩවී දිවි බේරාගත් තවත් පිරිසක් දැකගන්නට ලැබුණා. ඒ කළු ජල රළ පහර කැරකි කැරකී ගොඩබිමට ආ හැටි අපේ හදවත්වලත් තවම රැඳී තියෙනවා. ඒ අතර සිටි සන්ධ්‍යා එවක විශ්වවිද්‍යාලයේ දෙවැනි වසරේ අධ්‍යාපනය ලැබූ සිසුවියක්. ඒ රූප රාමුවල සිටි සන්ධ්‍යාට අවුරුදු 21ක් වෙලාත් තවමත් ඒ කම්පනය දරාගත නොහැකියි. ඇය එය විස්තර කර තිබුණේ නැතිගත් කම්පනයකින් යුතුවයි.

'මම සන්ධ්‍යා වික්‍රමසිංහ. පාසල් ගියේ ගාල්ල සවුත්ලන්ඩ් බාලිකා විද්‍යාලයට. මට අක්කා කෙනෙකුයි නංගි කෙනෙකුයි ඉන්නවා. මම පවුලේ දෙවැනියා. මගේ තාත්තා ප්‍රාදේශීය ලේකම්වරයෙක් විදියට සේවය කළා. එදා දෙසැම්බර් 26 වැනිදා අපි උදේ 7.30ට විතර ගෙදරින් පිටත් වුණේ කොළඹ යන්න. ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දෙවැනි වසරේ විභාගය පවත්වන්න තිබුණේ දෙසැම්බර් 27 වැනිදා. අපි ඒ විභාගයට තමයි පිටත් වුණේ. පිටත්වෙනකොට මට තාත්තා කිව්වා, මල් කඩලා මේසෙ උඩ තියලා ඇති. දුව බුදු පහන තියලා වැඳලා යන්න කියලා. ආයේ මම බෑග් එක තියලා බුදු පහන පත්තු කරලා වැඳලා තමයි ගියේ. අපි කෝච්චියේ යන්න කියලා ස්ටේෂන් එකට ගියා. පෝය දවසක් නිසා අද කෝච්චිය නැහැ කිව්වා. පස්සේ අපි බස් එකේ යන්න බස් ස්ටෑන්ඩ් එකට යනකොට එතැන තිබුණු බස් එකේ සෙනඟ නිසා යන්න හිතුණේ නැහැ. ඊළඟ බස් එක එනකල් හිටියා. තාත්තා ටිකක් වෙලා මාත් එක්ක ඉඳලා ගෙදර යන්න කියලා ගියා. කරාපිටිය බස් එකේ මාත් එක්ක හිටියා අය දෙනෙක් විතර. අපි එතැන ඉන්න කොට දැක්කා මිනිස්සු කලබලෙන් වගේ දුවනවා. මම දැක්කා සමනල පාලම ගාව සැරෙට රැල්ල ගහනවා. ඒක සාමාන්‍ය දෙයක් නිසා මම එච්චර ගණන් ගත්තේ නැහැ. ටිකක් වෙලා යනකොට පාරට වතුර දානවා දැක්කා. ඒක කළු පාට වතුරක්. එතැන බස්වලට නගින්න හිටපු කට්ටිය දුවන්න ගත්තා. මට හිතාගන්න බැරිවුණා මොකද්ද කියලා. ඊට පස්සේ දර කොටු කඩනවා වගේ කර කර සද්දයක් ආවා. මම බලනකොට සමනල පාලම කැඩිලා කෑලි කෑලිවලට යනවා. ඒක දැක්කාම මම ටිකක් බයවුණා. දැකලා නැහැනේ ඊට ඉස්සෙල්ලා මේ වගේ සිදුවීමක්.

බස් ස්ටෑන්ඩ් එකේ තට්ටු දෙකේ බිල්ඩින් එකක් තිබ්බා. ඒකේ තාප්පේ අස්සේ බස් එක හිරවෙලා. මං හිතන්නේ සිඩ්නි හොටෙල් කියලා බෝඩ් එකක් තිබ්බා. මට හුරු තැනක් වුණාට මොකද්ද කියලා දන්නේ නැහැ. මගේ අතේ ඒ වෙලාවේ ලැල්ල තිබුණා. අනිත් අය කිව්වා ඕක අතහරින්න කියලා. පස්සේ බස් ස්ටෑන්ඩ් එකේ මැද කොටසට යනකල් ගිහින් තිබුණේ. මැද කොටසට වෙනකල් යටින් ගිහින් තමයි උඩට ආවේ. ජනේලයක් ඇරලා තිබුණා. කට්ටිය කෑගහනවා එතැනින් උඩට එන්න කියලා. එතැනින් දෙන්නෙක් උඩට ගත්තා. බටයක් වගේ තැනක් තිබුණා. පස්සේ එතැන හිටපු අය කිව්වා මේ ළමයව උඩට ගන්න කියලා. මට මතකයි අවුරුදු 52ක විතර කෙනෙක් මාව උඩට ගත්තා. මට ඒ රූපේ හොඳට මතකයි. මම එයාට පින් දෙනවා. මොකද මාව බේරගත්තාට. පස්සේ එයාට උඩින් කෙනෙක් කතා කරලා උඩට එන්න කිව්වා. මම බටේ දිගේ උඩට නැග්ගා. මම එතැනට ගිහින් තාත්තා තමයි හෙව්වේ. තාත්තා මාව බස් එකට දාලා ගිය නිසා මගේ ඔළුවේ වැඩ කරන්නේ තාත්තා ගියාද තාත්තාට මොකද වුණේ කියලා. මේ සෙනඟ අස්සෙත් තාත්තාව හෙව්වා.

මට හොඳටම අමාරුයි. මම ඒත් තාත්තාව හොයන්න යනවා. මට කිව්වා ඔයා යන්න එපා කියලා. මට මතකයි මම තාත්තා තාත්තා කියලා කියනවා. බය වෙන්න එපා තාත්තා කොහේ හරි ඇති. අපි වතුර අඩු වුණාම තාත්තාව ගිහින් බලමු කියලා. කට්ටිය කිව්වා දෙපැත්තම කඩන් ගිහිල්ලා දැන් මේකත් කඩන් වැටෙයි කියලා. වාසනාවකට කඩන් වැටුණේ නැහැ. අපි වතුර බැස්සට පස්සේ පහළට බැහැලා තාත්තා බලනකොට මා ළඟ හිටිය අක්කා අනිත් අයට කිව්වා මෙයාට වතුර පෙවිලා ඉස්පිරිතාලේ අරන් යන්න කියලා. බස් එකක්වත් තිබුණේ නැහැ. බන්ධනාගාර බස් එකක් තමයි එතැන තිබුණේ. එතැන හිටිය හැමෝම ඒ බස් එකට දැම්මා. අපිව කරාපිටිය හොස්පිට්ල් එකට ගෙනිච්චා. පිටට ගහ ගහ ට්‍රොලියේ දාගෙන ගෙනිච්චා.

ගොඩාක් කට්ටිය අවා අපේ අය ඉන්නවාද කියලා බලන්න. මූණ හරෝලා බලනවා යනවා. එහෙම ගොඩාක් අය හිටියා තමන්ගේ කට්ටිය හොයාගෙන එන අය. මං හිටපු වාට්ටුවට දැම්මෙ සුනාමියට අහුවෙච්ච අය. අත්වල තුවාල තිබුණු අය. මට මතකයි මගේ අත්වල තුවාල. මීට් වැටිලා ඔළුව ඉදිමිලා තිබුණේ. ගොඩක් අය ආවා ඇඳුම් නැති අයට ඇඳුම් අරගෙන. ලොකු එකමුතුකමක් තිබුණා. නර්ස්ලා කිව්වා අපිට ඇඳුම් ගන්න කියලා. මම වාට්ටුවේ ඇඳේ හැරිලා හිටියා. මොකද හැරිලා ඉන්නෙ කිව්වා. මගේ ඔළුවේ ඉඳලා හැම තැනම වැලි තිබුණා. සැරින් සැරේ පිටට තට්ටු කර කර තමන්ගේ අයව හොයනවා. ටියුෂන් ක්ලාස් එකක ළමයි ගිහින් තිබුණා. එයාලද කියලා හොයනවා. මට තිබුණේ තාත්තා හොයන සිහිය. ටික වෙලාවක් යනකොට තාත්තා මාව හොයලා ඉස්පිරිතාලේ නම් ලිස්ට් එකේ නම දැකලා දුවගෙන ආවා. මාව බදාගත්තා. දවස් දෙකට පස්සේ මම ගෙදර ආවා.

ගෙදර ආවට ඒ කම්පනය අවුරුදු ගානක් යනකල් තිබුණා. කට්ටිය ගෙදර ආවාම අහනවා ඒ සිදුවීම ගැන. ඒත් මම කාලයක් කතා නොකර හිටියා. මං කියනවා මගෙන් මුකුත් අහන්න එපා කියලා. මට මගේ පොත් බෑග් හොයාගන්න ඕනේ වුණා. මං අම්මලාට කිව්වා යන්න ඕනේ ඒක බලන්න කොහේ හරි ඇති කියලා. ඒ කාලේ රත්‍රන් මාල කඩාගෙන යනවා. මං කොළඹ යනකොට ඒ මාලෙත් ගලවලා බෑග් එකට දාගෙන ගියා. මට ඕනෙ වුණා පොත් ටික හොයාගන්න. මට ඕනෙ වුණා ඊළඟ විභාගයට ලියන්න පොත් ටික සොයාගන්න ඕනේ කියලා. තාත්තා කිව්වා යන්න බැහැ රොඩු මඩ තියෙන්නේ එහේ කියලා.

මං පුරුද්දක් විදියට පොත්වල මගේ ටෙලිෆෝන් නම්බර් එක ලියලා තිබ්බා. ගෙදරට කෝල්ස් ආවා. කතා කරලා අහනවා මේ කෙනා ඉන්නවාද, සන්ධ්‍යා ඉන්නවාද, එයාගේ පෝත්වල කෑලි තිබ්බා මීනුවන්ගොඩ රේල් ගේට්ටුව ගාව කියලා. මං කිව්වා කවුරු වුණත් කමක් නැහැ මට පොත් තියනවා නම් ගෙනත් දෙන්න කියලා. එතකොට කිව්වා පොත් නැහැ පොත්වල කෑලි තියෙන්නේ කියලා. දවස් කිහිපයකට පස්සේ ස්ටේෂන් එකේ මගේ හැඳුනුම්පත තිබිලා කෙනෙක් ගෙනත් දුන්නා. කොහොම හරි විභාගේ කල් ගියා. කල් ගියාට පස්සේ මට ලියන්න මානසිකත්වයක් තිබුණේම නැහැ. ලියන්නෙ නැහැ කියලා හිටියේ. යාළුවෝ සර්ලා මගේ හිත හැදුවා. නෝට්ස් දුන්නා. කොහොම හරි ලියලා උපාධිය ගත්තා. ඊට පස්සේ අවුරුද්දේ සංගීත විශාරද විභාගය තිබුණා. ඒත් මගේ උගුරෙන් එන්නේ නැහැ ශබ්දය. එතැනදීත් ගුරුවරු කිව්වා ඔයාට පුළුවන් කොහොම හරි කරන්න කියලා. යාළුවෝ සර්ලා ඉන්නවා මගේ හයියට. ඒ විභාගෙත් සමත් වුණා. දැන් වුණත් මුහුද ගාවට ගියාම ලොකු රැල්ලක් එනවද කියලා බලනවා. ඒක තමයි මතකයට එන්නේ. පස්සේ මට ක්‍රීඩා අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරිනියක් වශයෙන් රැකියාව ලැබුණා. මං විවාහ වුණේ සුනාමියට පස්සේ අවුරුද්දේ. කාලයක් හම්බන්තොට හිටියා. පස්සේ ආයේ ගාල්ලට ආවා. මට දැන් දරුවෝ තුන්දෙනෙක් ඉන්නවා. තාම එයාලා පාසල් අධ්‍යාපනය ලබනවා...' යනුවෙන් ඇගේ කටුක අත්දැකීම විස්තර කළා.

අදත් මුහුද දිහා බලන හැම වෙලාවකම සන්ධ්‍යාගේ හදවත අහනවා 'ආයෙත් රැල්ලක් එයිද?' කියලා. ඒ බිය කවමදාවත් කිසිම වෛද්‍යවරයකුට සුව කරන්න බැහැ.

කාලය ගෙවෙනවා. දරුවන් ලොකු වෙනවා. ගෙවල් හැදෙනවා. පාරවල් අලුත් වෙනවා. නමුත් සමහර මතක අද වගේම තියෙනවා. 2004 දෙසැම්බර් 26 තවමත් බොහෝ මිනිසුන්ගේ හදවත් තුළ අද උදෑසනක් වගේම ජීවත් වෙනවා. ඒ කෑගැසීම් තවමත් හදවත් තුළ දෝංකාර දෙනවා. සමහර කඳුළු ඇස්වලින් වැටෙන්නේ නැහැ. ඒවා හදවත පුරා නිහඬව ජීවිත කාලය පුරා ගලාගෙන යනවා. මෙවැනි විපතක් උපදින මතු ආත්මයන්හිදී කිසිවකුටත් අත්නොවේවා කියලා අපි හදවතින්ම ප්‍රාර්ථනා කරමු.



නිලන්ති රේණුකා

---

# මීරිගම රෝහලට බ්‍රැන්ඩික්ස් වෙතින් ECG යන්ත්‍රයක්



මීරිගම මූලික රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකයට මෙතෙක් අත්‍යාවශ්‍යව තිබූ ECG යන්ත්‍රයක් පරිත්‍යාග කිරීමට පසුගියදා බ්‍රැන්ඩික්ස් සමාගම කටයුතු කළේය.

එම රෝහලේ මෙතෙක් කලක් විද්‍යුත් හෘද රෝග යන්ත්‍රයක් නොමැතිකම හේතුවෙන් ECG පරීක්ෂණ මන්දගාමී වීම නිසා බොහෝ රෝගීන්ට ගැටලුවලට මුහුණ පාන්නට හේතුවූ අතර, එම පරීක්ෂණය කරගැනීම සඳහා බොහෝ දුර ගෙවා වෙනත් ස්ථාන වෙත ගමන් කිරීමටද, ඒ සඳහා අධික මුදලක් ගෙවීමටද රෝගීන්ට සිදුව තිබුණි. මීරිගම මූලික රෝහලේ බලධාරීන් පැවැසුවේ බ්‍රැන්ඩික්ස් සමාගම විසින් ECG යන්ත්‍රයක් පරිත්‍යාග කිරීමෙන් පසු තම රෝහලේ සත්කාර සේවා සැලකිය යුතු ලෙස වැඩිදියුණුවී ඇති අතර, ඒ හේතුවෙන් වටිනා ජීවිත රැසක් බේරාගත හැකිවන බවයි.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඇඟලුම් සපයන්නා වන බ්‍රැන්ඩික්ස්, දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ රටේ සෞඛ්‍ය සේවා සඳහා ප්‍රමුඛ යෝජකයකු වී ඇත. මෙම සමාගම අඛණ්ඩව වසර 14කට වැඩි කාලයක් දිවයින පුරා ජීවිත සහ ප්‍රජාවන් සවිබල ගන්වමින් ශ්‍රී ලංකාවේ විශාලතම ආයතනික රුධිර පරිත්‍යාගශීලියාද වේ.

---

PAGE - 01

## නිවාස අඩස්සිය...

එම සිරකරුවන් අධීක්ෂණය කිරීම සඳහා විද්‍යුත් ක්‍රමයක් හඳුන්වා දීමටද යෝජනා වී ඇති බව දැනගන්නට තිබේ.

ඒ අනුව, විද්‍යුත් වළල්ලක් අදාළ රැඳවියාගේ අතෙහි හෝ පාදයෙහි පැලඳවීම හරහා ඔහු හෝ ඇය නිරන්තරයෙන්ම අධීක්ෂණයට ලක්කිරීම මේ හරහා සිදුවේ.

මේ සම්බන්ධයෙන් පසුගිය 2023 වසරේදීද යම් සාකච්ඡාවක් ආරම්භ වූ අතර, එහිදී ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගෙන් සමන්විත කමිටුවක් පත්කොට වාර්තාවක් ලබාගැනීමටද එවක අධිකරණ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ විජයදාස රාජපක්ෂ මහතා කටයුතු කොට තිබිණි.

ඒ අනුව එම වාර්තාව නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකිරීමටද අධිකරණ අමාත්‍යවරයා කටයුතු කොට තිබූ බවක් දැනගන්නට ඇත.

## සජිත්ට තහනමක්...

පාරිසර, ස්වභාවික සම්පත්, කෘෂිකර්මාන්තය හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරකසභා රැස්වීමේදී විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා හට කතා කිරීමට නොහැකි පරිදි වාරණයක් දැමීමට ආණ්ඩු පක්ෂය පියවර ගෙන ඇත.

පසුගිය සිකුරාදා දිනයේදී පාර්ලිමේන්තුවේ මෙම ආංශික කාරකසභා රැස්වීම පැවැති අතර, එම සාකච්ඡාව ආරම්භ වීමට පෙරාතුව ආණ්ඩු පක්ෂය විසින් එහි සභාපති හෙක්ටර් අප්පුහාමි මහතාට දැනුම් දී ඇත්තේ විපක්ෂ නායකවරයාට නිරීක්ෂකයකු ලෙස ඊට එක්වීමට ඉඩ දිය හැකි නමුත්, එහිදී අදහස් පළකිරීමට අවස්ථාවක් ලබාදිය නොහැකි බවකි.

විපක්ෂ නායකවරයා මෙම කාරකසභා රැස්වීමට සහභාගි වීමට සූදානමින් සිටියේ මේ වනවිට රට පුරා සිටින ගොවි ජනතාවගේ වීවලට තිසි මිලක් ලබාදීමට ආණ්ඩුව අපොහොසත් වීම සම්බන්ධයෙන් අදහස් දැක්වීමටය. නමුත්, රැස්වීම ආරම්භ වීමට පෙර ආණ්ඩු පක්ෂය විපක්ෂ නායකවරයාට අදහස් පළකිරීම තහනම් කිරීමට කටයුතු කිරීම නිසා ගොවි ජනතාව වෙනුවෙන් අදහස් දැක්වීමට විපක්ෂ නායකවරයාට තිබූ අවස්ථාව අහිමි වී ගොස් තිබීම විශේෂ සිදුවීමක් විය.

මේ ආකාරයෙන්ම හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ පාලන සමයේදීද විපක්ෂ නායකවරයා වෙත අදහස් දැක්වීමේ තහනමක් පැනවීමට එවක රජය කටයුතු කොට තිබිණි. ඒ, හර්ෂ ද සිල්වා මහතාගේ සභාපතිත්වයෙන් යුත් මුදල් කමිටු රැස්වීමේදීය.

එවකදී ආණ්ඩුවේ විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් සහ සේවක අර්ථසාධක අරමුදලට සිදුවන හානිය සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයෙන් දැඩිව ප්‍රශ්න කිරීමට විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා සූදානමින් පසුවීම එම තහනමට හේතු වී තිබිණි.

## ලංකාවට ඉල්ලයි...

දැනට වරෙන්තු මත සිටින මෙම රාජපක්ෂවරයාට එරෙහිව මෙරට අධිකරණය තුළ මූල්‍ය චෝදනා සම්බන්ධයෙන් නඩු කිහිපයක් ගොනුවී තිබේ.

නමුත් අවස්ථා රැසකදීම මෙම රාජපක්ෂවරයා එම අධිකරණ කටයුතුවලට සහභාගි නොවීම මුල්කරගෙන අධිකරණය විසින් වරෙන්තු නිකුත් කිරීමට පියවර ගෙන තිබිණි.

ඒ අනුව මෙරට විමර්ශන ආයතන මගින් මෙම ප්‍රබල රාජපක්ෂවරයා ලංකාවට ලබාදෙන ලෙස ඉල්ලා ඇමෙරිකාවේ අධිකරණ දෙපාර්තමේන්තුව වෙත ලිපි කිහිපයක් යොමුකොට ඇති අතර, ඊට ඇමෙරිකානු අධිකරණ දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිචාර දක්වා ඇති බවක්ද දැනගන්නට තිබේ.

## හර්ෂණට විශ්වාසභංගයක්...

ඝාතනය වූ බන්ධනාගාර නිලධාරීන්ගේ මෙන්ම රැඳවියන්ගේද ආරක්ෂාව පිළිබඳ සිය වගකීම සහ වගවීම ඉටු නොකිරීමට අපොහොසත් වීම හේතුවෙන් නානායක්කාර මහතාට එරෙහිව මෙම විශ්වාසභංග යෝජනාව ඉදිරිපත් කිරීමට විපක්ෂය තීරණය කර ඇත.

ඒ අනුව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් අමාත්‍යවරයාට එරෙහිව විශ්වාසභංග යෝජනාවට සිකුරාදා (10) පාර්ලිමේන්තුවේදී අස්සන් තබා තිබේ.

## නාමල්-සජිත්ට...

කිසිදු පිළිගත හැකි සාධාරණ හේතුවකින් තොරව උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යැමේ වයස දීර්ඝ කිරීමට ආණ්ඩුව දරන උත්සාහය පරාජයට පත්කිරීම සඳහා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකවරයා වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියලු පක්ෂවලට ආරාධනාවක් කරන ලෙස විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාගෙන් ඉල්ලීමක් කිරීමට පොහොට්ටුවේ ජාතික සංවිධායක නාමල් රාජපක්ෂ මහතා කටයුතු කොට ඇත.

විපක්ෂ නායකවරයා වෙත ලිපියක් යොමුකරමින් නාමල් රාජපක්ෂ මහතා පෙන්වා දෙන්නේ ඒ සම්බන්ධයෙන් සාකච්ඡාවක් කැඳවන ලෙසත්, ඊට පාර්ලිමේන්තුව නියෝජනය කළ සියලු දේශපාලන පක්ෂ නායකවරුන් සහ අනෙකුත් සුදුසු යැයි හැඟෙන දේශපාලන පක්ෂ නායකයන් කැඳවීම සුදුසු බවය.

මේ සම්බන්ධ ලිපිය සහ ඊට අදාළ වැඩිදුර තොරතුරු 'රාජ්‍ය රහස්' තීරයේ පළවේ.

## සමුළුව තීරණාත්මකයි...

අගවිනිසුරුවරයාගේ සහ උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යැමේ වයස වසර 2කින් දීර්ඝ කිරීම සම්බන්ධයෙන් දේශපාලන ක්ෂේත්‍රයේ විශාල කතිකාවක් මතුව පවතිද්දී ලබන 18 වැනි දින පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා අධිකරණ සේවා සංගමයේ මහා සභා රැස්වීම දෙස බොහෝ දෙනාගේ අවධානය යොමුවී ඇති බවක් දැකගන්නට තිබේ.

ඊට හේතු වී ඇත්තේ ශ්‍රී ලංකා අධිකරණ සේවා සංගමයේ සාමාජිකයන් ලෙස අධිකරණ නිලධාරීන්ට මෙන්ම දිසා විනිසුරුවරුන්, මහෙස්ත්‍රාත්වරුන් සහ අනෙකුත් විනිසුරුවරුන් ඇතුළත්ව සිටීම නිසාය.

මේ වනවිටත් ශ්‍රී ලංකා නීතිඥ සංගමය, ආසියානු නීතිඥ සංගමය සහ පොදුරාජ්‍ය මණ්ඩලීය නීතිඥ සංගමය ආණ්ඩුවේ මෙම උත්සාහයට එරෙහිව සිය විරෝධය පළකොට ඇති පසුබිමක ශ්‍රී ලංකා අධිකරණ සේවා සංගමය විනිසුරුවරුන්ගේ විශ්‍රාම කාලය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් දරන මතය කුමක්ද යන්න මෙම මහා සභා රැස්වීමේදී ප්‍රකාශයට පත්කරනු ඇති බව බොහෝ දෙනාගේ අදහස වී තිබේ.

## ජනාධිපති කතා නොකළේ...

රාජ්‍ය අනුග්‍රහය යටතේ පැවැත්වූ මහාවිහාරවංශික ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උපසම්පදා රාජ්‍ය මහෝත්සවයට සහභාගි වූ ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා තමන්ට නියමිතව තිබූ කතාව හෝ සිදු නොකොට උත්සව සභාව මැදදී හදිසියේම පිටව යැම සම්බන්ධයෙන් මේ වනවිට දේශපාලන ක්ෂේත්‍රයේ විශාල කතාබහක් මතුව තිබේ.

මෙහි ඇති විශේෂත්වය වන්නේ උත්සව සභාව ආරම්භ වී විනාඩි 40ක් පමණ රැඳී සිටි ජනාධිපතිවරයා හදිසියේම කිසිවකුටත් නොදන්වා සිය කතාවද සිදු නොකොට එම ස්ථානයෙන් පිටව යැමය.

එහිදී ජනාධිපතිවරයා සිය අසුනනෙන් නැගිට කෙළින්ම උත්සව සභාවේ සිටි විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා සමීපයට ගොස් ඔහුට අතට අත දී එම ස්ථානයෙන් පිටව ගිය ආකාරයක් දැකගත හැකි විය.

කෙසේ වෙතත් ජනාධිපතිවරයා සිය කතාව හෝ සිදු නොකොට රාජ්‍ය අනුග්‍රහය ලබාදී තිබූ උත්සවයකින් කිසිදු හේතුවක් නොදක්වා මෙසේ හදිසියේම පිටව යැම රැස්ව සිටි බොහෝ භික්ෂූන්වහන්සේලාගේ මවිතයට හේතුවී ඇති බවක්ද වාර්තා වේ.

## විජේ - ගජේන්ද්‍රන්...

තමිල්නාඩු මහ ඇමැති තලපති විජේ සහ උතුරේ සමස්ත ලංකා දෙමළ කොංග්‍රසයේ නායක ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් මහතා අතර විශේෂ හමුවක් පසුගිය සතියේදී චෙන්නායිහිදී සිදුව තිබේ.

මෙම හමුවේදී උතුරේ දෙමළ ජනතාව මුහුණ දෙන ප්‍රශ්න ඇතුළත් ලියවිල්ලක් ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් මහතා විසින් තමිල්නාඩු මහ ඇමැතිවරයා වෙත භාරදීමට පියවර ගෙන ඇත.

එම ලිපිය මගින් පොන්නම්බලම් මහතා උතුරු නැගෙනහිර දෙමළ ජනතාව මුහුණ දෙන දේශපාලන සහ මානව හිමිකම් ප්‍රශ්න පිළිබඳවත්, ඒකීය ව්‍යවස්ථාවක් වෙනුවට ෆෙඩරල් ව්‍යවස්ථාවක් යටතේ උතුරු නැගෙනහිරට දේශපාලන විසඳුමක් ලබාදීමේ අවශ්‍යතාව පිළිබඳවත් තමිල්නාඩු මහඇමැතිවරයා වෙත අවධාරණය කොට ඇති බව වාර්තා වේ.

මීට අමතරව උතුරේ ධීවරයන් මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන්ද දෙදෙනා අතර දීර්ඝ ලෙස සාකච්ඡා වී ඇති බවක් දැනගන්නට ඇත.

මෙම හමුවට ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් මහතාට අමතරව හිටපු මන්ත්‍රී සෙල්වරාසා ගජේන්ද්‍රන්, දෙමළ ජාතික හරිත ව්‍යාපාරයේ නායක පොනුතුරෙයි අයින්දරනේසන්, ප්‍රජාතන්ත්‍රවාදී ද්‍රවිඩ පක්ෂ නායක සහ ජනාධිපති නීතිඥ කේ.වී. තවරාසා, තාමරලිංගම් සුරේෂ්, නිල මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෝෂ්ඨ නීතිඥ කනකරත්නම් සුභාෂ් සහ නීතිඥ නඩරාජා කන්දීපන් යන අය සහභාගි වී තිබේ.

## ගාමිණී-මාලනී-විජය...

මෙරට සිනමා ලෝලීන්ගේ හදවත්වල සදාතනිකව රැඳී සිටින විජය කුමාරතුංග, ගාමිණී ෆොන්සේකා සහ මාලනී ෆොන්සේකා යන මහත්ම මහත්මීන්ගේ චරිත විනාශ කිරීමට කටයුතු නොකරන ලෙසට සහෝදර කලාකරුවන්ගෙන් විශාල ඉල්ලීමක් මේ වනවිට ඉදිරිපත් වෙමින් පවතින ආකාරයක් දැකගන්නට තිබේ.

ඔවුන් පෙන්වා දෙන්නේ විජය කුමාරතුංග, ගාමිණී ෆොන්සේකා සහ මාලනී ෆොන්සේකා යන ප්‍රවීණ නළු නිළියන්ගේ ජීවන චරිත අලළා චිත්‍රපට තැනීමේ මුවාවෙන් ඇතැම් මුදලාලිලා මේ වනවිට එම චරිත විනාශ කිරීමට කටයුතු කරමින් සිටින බවකි.

විශේෂයෙන්ම මෑත කාලයේදී අභාවප්‍රාප්ත වූ නිළි රැජින මාලනී ෆොන්සේකා මහත්මියගේ ජීවන චරිතය සම්බන්ධයෙන් චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීමට එක්තරා ව්‍යාපාරිකයෙකු කටයුතු කරමින් සිටින අතර, මේ වනවිට ඊට අදාළ තිර පිටපතද ලියා අවසන් කොට ඇති බවක් දැනගන්නට තිබේ.

නමුත් තවමත් එම තිරපිටපත මාලනී ෆොන්සේකා මහත්මියගේ පවුලේ කිසිදු ඥාතියෙකුට පෙන්වීමට කටයුතු කොට නැති බවටත්, ඒ සම්බන්ධයෙන් පැවැති මුහුරත් උළෙල සඳහා හෝ ෆොන්සේකා මහත්මියගේ පවුලේ කිසිවකුට ආරාධනා කර නොමැති බවටත් චෝදනා එල්ල වී තිබේ.

මේ සම්බන්ධයෙන් විශාල චෝදනාවක් නගමින් මාලනී ෆොන්සේකා මහත්මියගේ නැගණිය වන දමයන්ති ෆොන්සේකා මහත්මිය පසුගිය දිනෙක මෙම ව්‍යාපාරිකයා හට ලිපියක්ද යොමුකොට ඇති බවක් වාර්තා වේ.

එම ලිපියෙන් ඇය ඉල්ලා ඇත්තේ අදාළ චිත්‍රපටය නිර්මාණය කිරීමට ප්‍රථම එම තිරපිටපත සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා පවුලේ ඥාතීන්ට අවස්ථාවක් ලබාදෙන ලෙසටය.

FREE DIALOG DATA

# Dialog Pay

FREE DIALOG DATA

දැන් වෙළෙඳ සල් 100,000 කට අධික ප්‍රමාණයක්!

## ආහාරපාන/අවන්හල්

BARISTA
BR BASKIN ROBBINS
BURGER KING
CANAPÉ BISTRO
CRYSTAL JADE HONG KONG KITCHEN
Délifrance
Dinemore
Domino's Pizza
FRY my RICE
Indian Summer
Mochiato
Pizza Hut
POPEYES FAMOUS LOUISIANA CHICKEN
Spunchy
THE STATION
STREET BURGER
TACO SHACK

## සිල්ලර වෙළෙඳ සල් සහ සුපිරි වෙළෙඳ සල්

ARPICO SUPERCENTRE
softlogic GLOMARK
Keells
SPAR Supermarket

## එදිනෙදා සහ ගෘහස්ථ අවශ්‍යතා

Abans Better way to life
ASIRI HEALTH LIVE MORE
CEYLON VOYAGE
Service, redefined. Continental INSURANCE
DAMRO
EXCLUSIVE LINES
FOUNTAINS SIMPLY AMAZING
ICBT CAMPUS
LAUNDROMAT
LAKARCADE
ODEL LUV SL
ROVER VETERINARY HOSPITAL
SENKADAGALA FINANCE PLC
SINGER

## ප්‍රවාහන සේවා, කුරියර් සේවා සහ e-commerce

Citypak BY ADVANTIS
Daraz
Kangaroo Cabs 0112 588 588
PickMe
ups Authorised Service Contractor
FITS EXPRESS
wishque
XpressJobs

## Scan කර ගෙවන්න!

MyDialog App එකෙන් ගෙවා වැඩිපුර වාසි ලබාගන්න!




Scan කර, රෙජිස්ටර් වෙන්න!

## ඇඳුම් පැළඳුම්, විලාසිතා සහ උපාංග

amanté
Calvin Klein
CHARLES & KEITH
COCO
COOL PLANET
DILLY CARLO
DSI
KANDY
Levi's
MANGO
MIDNIGHT DIVAS
MIMOSA
NOLIMIT
NIKE
ODEL
PUMA
Samsonite
Spring & Summer
SWAROVSKI One Galle Face Mall
TOMMY HILFIGER
U.S. POLO ASSN. SINCE 1890
VERO MODA
zigzag



**මෙරට ඉතිහාසයේ බන්ධනාගාරයක් තුළ සිදුවූ දරුණුතම ඛේදවාචකය ලෙස සැලකෙන්නේ මීගමුව බන්ධනාගාරය තුළ පසුගිය 05 වැනිදා සහ 06 වැනිදා සිදුවූ මහා මිනිස් ඝාතනයයි. 29 දෙනකු අමු අමුවේ මරා දැමුණු එම ඛේදවාචකයට මුල සිරකරුවන් දෙපිරිසක් අතර වූ ගැටුමක් බවට ලඝුකරන්නට බලධාරීන් උත්සාහ ගත්තද එය ඊට එහා ගිය අපරාධයක් බව දැන් එළියට එමින් ඇත. මෙහිදී බන්ධනාගාර නිලධාරීන් 08 දෙනකු රැඳවුවන්ගේ ම්ලේච්ඡ පහරදීම්වලින් මරුමුවට පත්වූයේ මෙරට ඉතිහාසයේ බන්ධනාගාරයක් තුළදී නිලධාරීන් ඝාතනය වූ පළමු අවස්ථාව ලෙස සනිටුහන් වෙමිනි.**

ආදර්ශ බන්ධනාගාරයක් ලෙස පිටත සමාජය හමුවේ පෙනෙන්නට තිබුණු මීගමුව බන්ධනාගාරය තුළ පිටතින් වූ සුන්දරත්වය ඇතුළත නොවීම මේ තත්ත්වයට මුල්වූයේ යැයි සඳහන් කළහොත් වරදක් නැති තරම්ය. ඒ බව විමර්ශනවලින්ද දැන් අනාවරණ වෙමින් ඇත්තේ මීගමුව බන්ධනාගාරයේ අඳුරු පැතිකඩ එළියට එමිනි.

මීගමුව බන්ධනාගාරය තුළ මහා මිනිස් ඝාතනයකට පාර කැපෙන්නේ එහි සේවයේ නිරතව සිටි සහකාර අධිකාරිවරයාගේ සහ ප්‍රධාන ජේලර්වරයාගේ ස්ථාන මාරුවීම්ය. සහකාර අධිකාරිවරයා මාරුකර යැවෙන්නේ බූස්සටය. ඒ සේවා අවශ්‍යතාවක් මතය. එම ස්ථානමාරුවෙන් පසු වැඩි බරක් දරන්නට වන්නේ ප්‍රධාන ජේලර්වරයාටය. ඔහු ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ හිටපු සාමාජිකයකුගේ සහෝදරයෙකි. දැඩි පාලනයක් සහිතව ඔහු මීගමුව බන්ධනාගාරය තුළ මත්කුඩු ජාවාරමටත් දුරකතන භාවිතයටත් වෙනත් නීති විරෝධී වැඩවලටත් වැට බැන්දේය. මීගමුව බන්ධනාගාරය ආදර්ශ බන්ධනාගාරයක් ලෙස වැජඹෙන්නේ එබැවිනි. බන්ධනාගාරය තුළ ජාවාරම්වලට වැට බැඳීමට ඔහුට පහසුවක් වන්නේ රැඳවුවන් අතර සිටි තොරතුරුකරුවන් පිරිසකි. එම තොරතුරුකරුවන් අනාරක්ෂිත වන්නේ වාර්ෂික ස්ථාන මාරු යටතේ ඔහුත් ස්ථාන මාරු ලැබ මහර බන්ධනාගාරය වෙත යාමත් සමගිනි. බන්ධනාගාරය තුළ විවිධ ජාවාරම්වලට සම්බන්ධව සිටි පිරිසක් විසින් පසුගිය 05 වැනිදා පහරදී මරාදමන්නේ ද සහකාර අධිකාරිවරයාගේ සහ ප්‍රධාන ජේලර්වරයාගේ තොරතුරුකරුවන් දෙදෙනෙකි. එම ප්‍රහාරය එල්ල වන්නේ ඔහු ස්ථාන මාරු ලැබ දින දෙක තුනක් ඇතුළතය. බන්ධනාගාරය තුළ ජාවාරම්කරුවන් සහ ඔවුනට එරෙහි කණ්ඩායම් දෙකක ගැටුමක් ලෙස 05 වැනිදා හටගත් ගැටුමෙන් රැඳවුවන් දෙදෙනෙක් මියගොස් 35 දෙනෙක් පමණ තුවාල ලැබීය. එම ගැටුම දුරදිග යන්නට නොදී රාත්‍රී කාලය වනවිට පාලනය කරනු ලබන්නේ මීගමුව බන්ධනාගාරයේ නිලධාරීන් වීම විශේෂිතය. එදා රෑ මීගමුව බන්ධනාගාරය සාමකාමීය. ගැටුමක් සිදුවූ නැති ගානය. අගුල් නොදැමූ සිරකුටිවල කිටිකිටියේ සුපුරුදු ලෙස රැඳවුවන් ගුළිවී නිදා ගත්තේය. ඒ 600කට පහසුකම් තිබුණද 2,400ක් පමණ වූ අධික පිරිසකගෙන් සැමන් පැක් කරන ආකාරයට සිරකුටි පිරී තිබුණු බැවිනි.

එදා සාමකාමී රාත්‍රිය තුළ බන්ධනාගාරය තුළ සිදුවී තිබුණේ අබිරහස් සිදුවීමකි. පසුදින රැඳවුවන් කුපිත වන්නට බලපෑවේ එයයි. ඒ බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන විමර්ශනවලින් ඉදිරියේදී හෙළිවනු ඇත. ඒ ගැන කෙතරන විමර්ශනවලට ඉඩ තබා මෙහි ඒ ගැන කිසිවක් සටහන් තබන්නේ නැත. ඒ බන්ධනාගාර නිලධාරීන් 08 දෙනකු ඇතුළු 26 දෙනෙක් අමුඅමුවේ බන්ධනාගාරය තුළ මරාදැමීමට මුල්වන්නේ එය වන බැවිනි.

පසුදින උදෑසනද බන්ධනාගාරය සාමකාමීය. වැඩ පාට්ටිල රැඳවුවන් ඔවුන්ට පැවරී ඇති කටයුතුවල නිරත වෙමින් සිට ඇත. උදෑසන ආහාරය රැඳවුවන් වෙත සකස් කර ඔවුන්ට කන්නට ඒ වනවිටත් දී තිබී ඇති බව සඳහන්ය. මේ ගැන තවදුරටත් විමර්ශනවලින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හෙළිකර ගනු ඇත. අධිකරණවලට එදින රැගෙන යාමට නියමිත රැඳවුවන්ද බන්ධනාගාර නිලධාරීන් ඒ වනවිටත් සූදානම් කරමින් සිට ඇති බවද කියැවෙයි. කොළඹ සිට 'බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ' පිරිසක් මීගමුව පැමිණෙන්නේත්, බන්ධනාගාරය තුළ නොසන්සුන් තත්ත්වයක් ඇතිවන්නේත්, මරණ සිදුවන්නේත් අනතුරුවය. ගැටුමට මුල්වූ කරුණු මෙවිට තැබීම, පසුදින ගැන මෙහි සටහන් තබන්නේ නැත. එය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සහ මානව හිමිකම් කොමිසම විසින් නුදුරේම සිය විමර්ශන ඔස්සේ හෙළිකරනු ඇත. දැනට ඒ ගැන කිසිවක් සටහන නොතබන්නේ විමර්ශනවලට එය බාධාවක් වන බැවින් සහ ඒ සියල්ල ආන්දෝලනාත්මක තුඩුදෙන කරුණු බැවිනි.

බන්ධනාගාර තුළදී පහරකෑමට ලක්ව මියගිය නිලධාරීන් 08 දෙනාම 'බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ' සාමාජිකයන්ය. බන්ධනාගාර පද්ධතිය තුළ මේ කණ්ඩායම හඳුන්වන්නේ 'බන්ධ පොලිස්' යැයි කියාය. ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව පැවති සමයේදී බන්ධනාගාර තුළ සිදුවන ජාවාරම් මැඩලීමට මෙම බලකාය ස්ථාපිත කිරීමට මූලික පියවර ගන්නේ 2021 පෙබරවාරියේදීය. හමුදාවේ හිටපු සාමාජිකයන්ගෙන් ද සැදුම්ලත් මෙම බලකාය නිල වශයෙන් මෙහෙයුම් සඳහා යොදවන්නේ යැයි සඳහන් වන්නේ 2022 ජනවාරි 26දා සිටය. වැලිකඩ, මැගසින්, බූස්ස ඇතුළු බන්ධනාගාර කිහිපයක් ආශ්‍රිතව මෙම කණ්ඩායම ස්ථාපිත කර ඇති අතර බන්ධනාගාර ආශ්‍රිතව සිදුවන ජාවාරම් මැඩලීමට ඔවුන් කරනු ලබන සේවය අතිමහත්ය. 06 වැනිදා උදෑසන වැලිකඩ සිට කණ්ඩායමක් මීගමුව බන්ධනාගාරයට ගොස් ඇත්තේ ඉහළ නිලධාරියකු විසින් ලබාදුන් නියෝගයකට අනුවය. දැනගන්නට ඇති ආකාරයට එහිදී මුලින්ම බන්ධනාගාරය තුළට ඇතුළු වී ඇත්තේ එම කණ්ඩායමේ 10 දෙනෙකි. ඒ වනවිටත් මීගමුව බන්ධනාගාරයේ සේවයේ නිරත නිලධාරීන් පිරිසක්ද බන්ධනාගාරය තුළ රැඳීසිට ඇත.

කලහාකාරී වූ රැඳවුවන් සංවිධානාත්මකව පහරදී ඇත්තේ ඇතුළට පැමිණි බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ නිලධාරීන්ටය. බිම පෙරළාගෙන අතින් පයින් මෙන්ම පොලු මුගුරුවලින් පහරදී හිසට මල් පෝච්චි පවා අතහැර අනතුරුව අමානුෂික ලෙස වධ බන්ධන පවා කර ඇති බව සඳහන්ය. සිරුරේ අවයවවලට පවා හානිකර ඇති අතර සිරුරේ අභ්‍යන්තරයට පොලු මුගුරු පවා රිංගවමින් ම්ලේච්ඡ ලෙස ඔවුන්ව මරාදමා ඇති බව සඳහන්ය. මීගමුව බන්ධනාගාරයේ නිලධාරීන් ඔවුන්ව බේරාගැනීමට දැඩි උත්සාහයක් ගත්තද අවසානයේදී රැඳවූවන්ගේ ප්‍රහාරයන්ට එම නිලධාරීන් ලක්ව තුවාල ලැබීය. පිටත සිටි නිලධාරියෙක් බන්ධනාගාරයේ ප්‍රධාන දොරේ කවුළුවකින් ටී 56 ගිනි අවියකින් වෙඩි තබන්නේ ඇතුළත සිරවී සිටි සිය සගයන් බේරා ගන්නටය. එහෙත් ඒ වනවිටත් නිලධාරීන් 07 දෙනෙක් මියගොස් හමාරය. 08 වැන්නා මියයන්නේ කොළඹ ජාතික රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටියදීය. ඇතුළට ගිය නිලධාරීන් අතරින් තවත් දෙදෙනෙක්ද සිටින්නේ ප්‍රතිකාර ලබමිනි. ඔවුහුද බරපතළ ලෙස පහරකෑම්වලට ලක්ව සිටිති.

මෙම සිදුවීම අතර බන්ධනාගාරය තුළ සිදුකරන ජාවාරම් ගැන තොරතුරු සැපයූ තවත් රැඳවූවන් දෙදෙනෙකුට පහරදී මරා දමා තිබුණේය. ඒ හැරුණු කොට තවත් දෙදෙනෙක් සිටින්නේ අමානුෂික ලෙස ප්‍රහාරයට ලක්වය. කෙසේ වෙතත් මෙම ගැටුම් අවසානයේදී කළ ගණනය කිරීම්වලින් කියැවුණේ රැඳවූවන් 21 දෙනෙක් මියගොස් ඇති බවය. 05 වැනිදා 02ක්, 06 වැනිදා 18ක් සහ 07 වැනිදා 01ක් වශයෙනි.

මේ අතරින් පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ මියගිය රැඳවූවන් 17 දෙනා අතරින් රැඳවූවන් 14 දෙනෙක්ම මියගොස් ඇත්තේ වෙඩි වැදීම්වලිනි. එක් රැඳවූවෙක් සම්බන්ධයෙන් ලබාදී ඇත්තේ විවෘත තීන්දුවකි. දෙදෙනක් මියගොස් ඇත්තේ පහරදීම්වලිනි. රැඳවූවන් 04 දෙනෙකුගේ පශ්චාත් මරණ පරීක්ෂණ සිදුකර නොතිබුණි. ඒ අතර ඉන්දියානුවෙක්ද සිටියි.

මීගමුව බන්ධනාගාරය තුළ ඉඩකඩ ඇත්තේ රැඳවූවන් 600කට පමණි. එහෙත් ගැටුම සිදුවන විට එහි සිටි රැඳවූවන් ගණන 2,400කට වැඩිය. ඒ අතර සියයට 80ක් 90ක් පමණ සිටියේ රිමාන්ඩ් සිරකරුවන්ය. ඒ අතරින්ද සියයට 90කට වැඩි පිරිසක් සිටියේ මත්කුඩු භාවිතයට ඇබ්බැහිවූවන්ය. එය දේශබන්දුගේ 'යුක්තියෙන්' මෙන්ම වත්මන් ආණ්ඩුවේ 'රටම එකට' මෙහෙයුම්වලින් පොලිසිය ඉවක්බවක් නොමැතිව මත්කුඩු ජාවාරම්කරුවන් වෙනුවට මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් විශාල වශයෙන් අත්අඩංගුවට ගැනීමේ ප්‍රතිඵලයක් යැයි සඳහන් කළහොත් වරදක් නැති තරම්ය.

බන්ධනාගාර පද්ධතියට දරාගැනීමට නොහැකි තරම් රැඳවූවන් පිරිසක් රඳවා තැබීම නිසාම ඒ තුළින් ඇතිවන ගැටලු බන්ධනාගාර පද්ධතිය තුළ නිරන්තරයෙන් ඇතිකරනුයේ ගැටුම්ය. රැඳවූවන්ගේ මානව හිමිකම් මෙන්ම සමස්ත සමාජ ආරක්ෂාවට පවා ගෙන දෙන්නේ බරපතළ ප්‍රතිවිපාකන්ය. රැඳවූවන් මානසික ආතතිය සහ අසහනයන්ට ලක්වීම තුළින් ඔවුන් ප්‍රකෝපවීම භයානක ප්‍රතිඵල අත්කර දෙන්නෙකි.

මීගමුව බන්ධනාගාරය තුළ අධික සනත්වය බන්ධනාගාර පද්ධතියට දරාගැනීමට නොහැකි තත්ත්වයක් වුවත් එය නිලධාරීන් විසින් උපක්‍රමශීලීව පාලනය කර ගත්තේය. එහෙත් වැඩ වරදින්නේ සහකාර අධිකාරිවරයාගේ සහ ප්‍රධාන ජේලර්වරයාගේ ස්ථානමාරු සමග බන්ධනාගාර නිලධාරීන්ට ඇතුළේ දේවල් ගැන තොරතුරු දුන් රැඳවූවන්ට ජාවාරම්වලට සම්බන්ධ රැඳවූවන් විසින් පහරදීමෙනි. එය අවසානයේදී පුපුරා යන්නේ නිලධාරීන් 08 දෙනකු ඇතුළු 29 දෙනෙකුගේ ජීවිත අහිමිකරමිනි. මෙහිදී තුවාල ලැබූ නිලධාරීන් ගණනද බොහෝය.

එදා පොලීසිය සහ හමුදාව පැමිණි බන්ධනාගාරය පිටත ආරක්ෂාව සැපයූවත් බන්ධනාගාරය ඇතුළේ සිදුවන සිරකරුවන්ගේ අරගලය මැඩලීමට ඇතුළට පැමිණෙන ලෙසට ඒ අයගෙන් කිසිදු ඉල්ලීමක් කර නොතිබුණි. මධ්‍යම අපරාධ විමර්ශන කාර්යාංශයේ නියෝජ්‍ය පොලිස්පති චන්දන කොඩිතුවක්කු මහතා පවසන්නේ පොලිසියට මේ ගැන කියනකොට බොහෝ දේවල් සිදුව හමාර බවය. බන්ධනාගාර පද්ධතිය භාරව සිටින වත්මන් ආණ්ඩුවේ ඇමැතිවරයා වන නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා මියගිය නිලධාරීන්ට අවසන් ගෞරවය දැක්වීමට පැමිණි අවස්ථාවේදී බන්ධනාගාර නිලධාරීන් ඔහුව වටකරගෙන සිටියදී එක් නිලධාරියෙක් පවසන්නේ නියපොත්තෙන් කඩන්නට තිබූ දෙයක් දුරදිග ගිය බවය. ඔහු එහිදී පවසන්නට වූයේ නිසි වෙලාවට නියෝග නොලැබුණු බවය. එසේ නම් එම නිලධාරීන්ට නිසි නියෝග ලබා නොදුන්නේ කවුරුන්දැයි තවමත් එළියට පැමිණ නැත. එය යම් දවසක එළියට එනු ඇත. එහිදී මීගමුව බන්ධනාගාරයේ ගැටුම හා බැඳුණු නිලධාරීන් 08 දෙනෙකුගේ මරණය මෙන්ම රැඳවූවන්ගේ මරණ ගැන බොහෝ තොරතුරු එළියට එනු ඇත. එවිට 'වගකීම භාරගන්නාවා. සොරි' යැයි කියා ගැළවෙන්නට කිසිවකුටත් ඉඩක් නොලැබෙනු ඇත.

# හිරගෙවල් ඇතුළේ මරාගත් වර්තමානයයි ඉතිහාසයයි මෙන්න...




## බන්ධනාගාර ආශ්‍රිතව මෑත ඉතිහාසයේ ඇතිවූ කැරලි කෝලාහල

### 01. වැලිකඩ බන්ධනාගාරයේ දෙමළ රැඳවුවන් 53 කට මරණය ගෙන දුන් 83 කළු ජූලියේ බන්ධනාගාර ගැටුම

1983 කළු ජූලිය ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ දරුණු කළු පැල්ලමක් එක්කළ සිදුවීමකි. එදා මුළු රටම ගිනි ගනිමින් දැවෙද්දී වැලිකඩ බන්ධනාගාරය තුළ සිදුවූ මහා මිනිස් සංහාරයක් සිදුවන්නේ බන්ධනාගාර ඉතිහාසයේ දැවැන්තම ඛේදවාචකවලින් එකක් බවට එය පත්කරමිනි. ඒ දෙමළ රැඳවූවන් 53 දෙනෙකු අමු අමුවේ ඝාතනය කරමිනි. මෙම මහා මිනිස් සංහාරය සිදුවන්නේ ජූලි 25 සහ 27 යන දෙදින තුළදීය. එදා ඒ මහා මිනිස් සංහාරය සිදුවන්නේ සිංහල රැඳවූවන් පිරිසක් ජාත්‍යාලයෙන් මුසපත්ව චැපල් වාට්ටුවට කඩාවැදී පොලු මුගුරුවලින් සහ යකඩ පොලුවලින් පහරදීමෙනි. 25 වැනිදා එල්ල වූ ඒ පළමු ප්‍රහාරයෙන් මරුමුවට පත්වන දෙමළ රැඳවූවන් ගණන 35 දෙනෙකි. දෙවැනි ප්‍රහාරය එල්ල වන්නේ 27දාය. එහිදී දෙමළ රැඳවූවන් 18 දෙනකුට ජීවිත අහිමිවූ බව ඉතිහාසයේ සඳහන්ය.

මෙහිදී ප්‍රහාරකයන්ගේ ප්‍රධාන ගොදුරු බවට පත්වන්නේ ටෙලෝ නායකයෙක් වූ සෙල්වරාජා යෝග චන්ද්‍රන් නොහොත් කුට්ටමනී, එම සංවිධානයේම ක්‍රියාකාරිකයෙක් වූ නඩරාජා තංගතුරෙයි, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි ක්‍රියාකාරිකයෙක් මෙන්ම ගාන්ධි මතධාරියෙක් වන ආචාර්ය ජයතිලක රාජා යන අයයි.

බන්ධනාගාරය පැත්තෙන් මෙම ප්‍රහාරය වළක්වාලීමට කොතෙකුත් හැකියාවක් තිබුණද ඒ සඳහා වැඩි උනන්දුවක් ඔවුනට තබා ආරක්ෂාවට සිටි හමුදා සේනාංකවලටවත් පවා තිබී නැත. ඒ ඉහළින් ඊට අවශ්‍ය නියෝග ඔවුන්ට ලැබී නොතිබුණු බැවිනි. මෙම ප්‍රහාරය එල්ල කළා යැයි කියැවෙන්නේ දෙමළ සිරකරුවන්ගේ නාමලේඛනයක් ඇතැතිවය. මේ පිටුපස සිටියේ යැයි කියනු ලබන්නේ ජේ.ආර්.ගේ රජයේ ජාතික සේවක සංගමයේ වෘත්තීය සමිති ක්‍රියාකාරිකයන් පිරිසකි. ඉහළ පෙළේ දේශපාලනඥයන්ගේ රැකවරණ ලැබූ එම වෘත්තීය සමිති කණ්ඩායමට එරෙහිව නීතිමය පියවරක් හෝ දඬුවමක් ලබාදුන් බවට තොරතුරක් අදටත් සොයාගන්නට නැත.

මෙම මිනිස් සංහාරය සිදුවන විට ජේ.ආර්. ආණ්ඩුවේ බන්ධනාගාර විෂය භාරව සිටියේ අධිකරණ ඇමැති ධුරය දැරූ නිශ්ශංක පරාක්‍රම විජයරත්න මහතාය. ඔහුට මෙන්ම රජයටද එකල ජාත්‍යන්තර අප්‍රසාදය පළවුවත් රජයක් හැටියට එම සිදුවීම සැලකුවේ 'රැඳවියන්ගේ කැරැල්ලක්' ලෙස සුළුවෙනි. එය සැලසුම්සහගත ක්‍රියාවක් නොවන බව රජයේ ස්ථාවරත්වය විය. එකල ආණ්ඩුවේ ප්‍රබල අමාත්‍යවරයෙක් වූ ලලිත් ඇතුලත්මුදලි මහතා පවා එම සිදුවීම සාධාරණීකරණය කරන්නට වූයේ 'සිංහල ජනතාවගේ ක්‍රෝධය පාලනය කරගත නොහැකිව සිදුවක්' යැයි ආන්දෝලනාත්මක ප්‍රකාශයක් සිදුකරමිනි.

මෙම සිදුවීම මුල්කරගෙන එදා ජේ.ආර්. ආණ්ඩුවේ කිසිදු ඇමැතිවරයෙක් ඉල්ලා අස්වීමක් හෝ සමාව ගැනීමක් සිදුවූයේ නැත. ඔවුන් හැම විටම එම සිදුවීම හුදෙක් සාමාන්‍ය සිදුවීමක් ලෙස දකින්නට විය. නමුත් 2004 වසරේදී එවකට ජනාධිපතිනිය වූ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය විසින් එම සිදුවීම ඇතුළු සමස්ත කළු ජූලියේදී වූ සිදුවීම් සම්බන්ධයෙන් නිල වශයෙන් රජයක් ලෙස සමාව අයදින ලදී.

ඊට පෙර 2001 වසරේදී ජනාධිපති සත්‍ය සෙවීමේ කොමිසමක් (Presidential Truth Commission) පත් කළ ද, වැලිකඩ බන්ධනාගාර ඝාතනය සම්බන්ධයෙන් කිසිදු සාපරාධී පුද්ගලයකු අධිකරණය හමුවට පමුණුවා දඬුවම් ලබාදීමට ඇගේ රජය සමත්වූයේ නැත.

### 2. 1988 දෙසැම්බර් 13දා වැලිකඩ බන්ධනාගාර ගැටුම. ජවිපෙ සිරකරුවන් 221ක් පලායයි

1983 ජූලි කලබලය අස්සේ වැලිකඩ බන්ධනාගාරය තුළ සිදුවූ මහා මිනිස් සංහාරය ගැන ජේ.ආර්. ආණ්ඩුව මෙන්ම බන්ධනාගාරය විෂය භාර ඇමැතිවරයා මුනිවත රැක්කද 1988 දෙසැම්බර් 13 වැනිදා ජනතා විමුක්ති පෙරමුණේ සන්නද්ධ අංශය විසින් මැගසින් බන්ධනාගාරයට එල්ල කළ ප්‍රහාරය සම්බන්ධයෙන් නම් එසේ නොවීය. එය සැලකෙන්නේ සිරකරුවන්ගේ කැරැල්ලක් ලෙසිනි. වැලිකඩ සහ මැගසින් බන්ධනාගාර ආශ්‍රිතව ඇතිවූ එම කැරැල්ල මෙරට ඉතිහාසයේ සිදුවූ දරුණුතම සිරකරු කැරලිවලින් එකක් ලෙස සැලකෙයි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටි රැඳවූවන් 221 දෙනෙක් එදා බන්ධනාගාරය බිඳ පලාගියේය. මේ කැරැල්ල වැලිකඩ සහ මැගසින් බන්ධනාගාරවලට පමණක් සීමාවූයේ නැත. බෝගම්බර මෙන්ම පැලවත්ත සංක්‍රමණ කඳවුරු දක්වා ව්‍යාප්ත වී තිබුණි. පැලවත්ත කඳවුරෙන්ද රැඳවූවන් 131 දෙනෙක් පලා ගියහ. මෙහිදී පලායන වැඩි දෙනෙක් ජවිපෙ සාමාජිකයන්ය.

මෙම කැරැල්ල සැලකෙන්නේ බන්ධනාගාර ඉතිහාසයේ ආරක්ෂාව බිඳවැටුණු මෙන්ම වැඩිම සිරකරුවන් පිරිසක් එකවර පලාගිය අවස්ථාව ලෙසිනි. බන්ධනාගාර පද්ධතියේ ආරක්ෂාව ගැන අලුතින් හිතන්නට පවා බලධාරීන් පියවර ගත්තේ අනතුරුවය. බන්ධනාගාරගතව සිටි සිය නායකයින් මුදාගැනීමට දියත් කළ එම කැරැල්ල සිදුවන විට බන්ධනාගාර නිලධාරීන් සිටින්නේ වර්ජනයකය. බන්ධනාගාර ඉතිහාසයේ පළමු වරට එම වර්ජනය දියත්කරනු ලබන්නේ ඉහළ වැටුප් සහ ආරක්ෂක පහසුකම් ඉල්ලාය. බන්ධනාගාර නිලධාරීන් රාජකාරිවලින් බැහැරව සිටි බැවින් එදා බන්ධනාගාරවල ආරක්ෂාවට යොදවා සිටියේ ත්‍රිවිධ හමුදාවන්ය. කැරැල්ල සිදුවන්නේ ඒ අතරතුරදීය. එහිදී බන්ධනාගාරයේ දේපොළවලට පවා දැඩි හානි සිදුකර තිබුණු බව බන්ධනාගාර තොරතුරුවල සඳහන්ය.

1983 ජූලි 25 සහ 27දා වැලිකඩ බන්ධනාගාරය තුළ මහා මිනිස් සංහාරය සිදුවූ අවස්ථාවේදී ඉල්ලා අස්නොවූ ඇමැති දේශමාන්‍ය ආචාර්ය නිශ්ශංක විජේරත්න මහතා සමග නියෝජ්‍ය අමාත්‍ය ෂෙල්ටන් රණරාජා මහතා එවර ඉල්ලා අස්වන්නේ සදාචාරාත්මක වගකීම භාරගනිමිනි. ඒ එම සිදුවීම වන විට වෛද්‍ය ප්‍රතිකාර සඳහා ඇමැතිවරයා විදේශගතව සිටියත් තමා යටතේ ඇති ආයතනයක සිදුවූ බරපතළ ආරක්ෂක දෝෂයේ වගකීම භාරගනිමිනි. එම ඉල්ලා අස්වීමෙන් පුරප්පාඩු වන ඇමැති ධුරයට ජේ.ආර්. ජයවර්ධන අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන්නේ ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයකු සහ නීතිඥයකු වූ ඒ.පී. පෝල් පෙරේරා මහතාය.

ශ්‍රී ලාංකීය දේශපාලන ඉතිහාසය තුළ කිසිදු බලපෑමකින් තොරව, තමන්ගේ හෘද සාක්ෂියට එකඟව මෙවැනි බරපතළ වරදක වගකීම භාරගෙන ඇමැති ධුරයකින් ඉල්ලා අස්වූ ඉතාම දුර්ලභ සහ ආදර්ශමත් සිදුවීමක් ලෙස මෙය ඉතිහාසයට එක්ව හමාරය. එම ඉල්ලා අස්වීම සිදුවන්නේ 1988 වසරේ නොවැම්බර් මාසයේදී වන අතර, ඒ වනවිට රටේ ඊළඟ ජනාධිපතිවරයා තෝරාගැනීමට නාමයෝජනා පවා කැඳවා තිබීම විශේෂත්වයකි.

එවක අග්‍රාමාත්‍යවරයාව සිටි රණසිංහ ප්‍රේමදාස, විපක්ෂ නායිකාව වූ සිරිමාවෝ බණ්ඩාරනායක සහ ඔසී අබේගුණසේකර යන මහත්ම මහත්මීන් ජනාධිපති ධුරයට තරග කළ අතර, 1988 දෙසැම්බර් 19 වැනිදා පැවැති මැතිවරණයෙන් දෙවැනි විධායක ජනාධිපති ධුරයට තෝරා පත්කර ගන්නේ රණසිංහ ප්‍රේමදාස මහතාය. 1989 ජනවාරි 02 වැනිදා ඔහු ජනාධිපති ධුරයේ දිවුරුම්දී වැඩ ආරම්භ කර 1993 මැයි 01 වැනිදා අභාවප්‍රාප්ත වන තුරුම බන්ධනාගාර ආශ්‍රිතව දරුණු ප්‍රචණ්ඩ ක්‍රියා සහ කැරලි කෝලාහල සිදුවීම් කිසිවක් වාර්තා වන්නේ නැත.

### 03. සිරකරුවන් 03කට මරණය ගෙන දුන් කළුතර බන්ධනාගාර ගැටුම - 1997 දෙසැම්බර් 12

කළුතර බන්ධනාගාරයේද විටින් විට ගැටුම් සහ නොසන්සුන්තා ඇතිවූවත් 1997 වසරේ දෙසැම්බර් 12 වැනිදා සිදුවූ ලේ වැගිරීම ජාත්‍යන්තරයේ පවා කතාබහකට ලක්වූවකි.

බන්ධනාගාරයේ සිටි සිංහල රැඳවියන් පිරිසක් විසින් එල්.ටී.ටී.ඊ. සැකකාර රැඳවූවන් පිරිසක් රඳවා සිටි මැදිරි වෙත කඩාවැදී ප්‍රහාරයක් එල්ල කළ එම සිදුවීමෙන් දෙමළ රැඳවියන් 03 දෙනකු මියගොස් 17 දෙනෙක් බරපතළ තුවාල ලැබීය.

සිරමැදිරි කඩාගෙන ගොස් 200කට අධික රැඳවූවන් පිරිසක් පොලු මුගුරුවලින් සහ ගල්වලින් පහරදී මෙම අපරාධය සිදුකරන ලදී. මෙම ගැටුම මැඩලීමට එකල නිසි පියවර නොගත් බවට බන්ධනාගාරයට චෝදනා පවා එල්ල විය.

එවක සිටි ජනපති චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය විසින් මේ පිළිබඳ සොයාබැලීමට කොමිසමක් පවා පත්කරනු ලැබීය. එවක මහාධිකරණ විනිසුරුවරයෙක් වූ රාජා ප්‍රනාන්දු මහතාගේ සභාපතිත්වයෙන් යුත් ත්‍රිපුද්ගල කොමිසම 1998 පෙබරවාරි 14දා සාක්ෂි විභාගය ආරම්භ කරනු ලැබීය. 1998 අප්‍රේල් 23දා දක්වා මාස දෙකකට අධික කාලයක් රැඳවූවන්, බන්ධනාගාර නිලධාරීන්, ආරක්ෂක අංශ සාමාජිකයන් ඇතුළු පුද්ගලයන් 61 දෙනකුගෙන් කොමිසම සාක්ෂි විමසන ලදී.

බන්ධනාගාර පරිපාලනයේ සහ ආරක්ෂාවේ පැවති බරපතළ අඩුපාඩු රැසක් පෙන්වා දෙමින් කොමිසම විසින් සිය වාර්තාව භාරදුන්නද අදටත් ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගයක් දැනගන්නට නැත. මෙම සිදුවීම එදා ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධානවල දැඩි දෝෂ දර්ශනයටද ලක්විය.

### 04. 2000 ඔක්තෝබර් 25 බිඳුණුවැව රැඳවුම් කඳවුරේ 27 දෙනෙක් ඝාතනය කර 14කට බරපතළ තුවාල සිදුකිරීම

බිඳුණුවැව පිහිටි රැඳවුම් සහ පුනරුත්ථාපන මධ්‍යස්ථානයට පහරදී එහි සිටි එල්.ටී.ටී.ඊ. සැකකරුවන් 27 දෙනෙක් ඝාතනය කර 14 දෙනකුට තුවාල කිරීමද ජාත්‍යන්තරය ඉදිරියේ ශ්‍රී ලංකා නාමයට එක් වූ තවත් එක් කළු පැල්ලමකි. චන්ද්‍රිකා ආණ්ඩුව පැවැති 2000 වසරේ ඔක්තෝබර් 25 වැනිදා මෙම පහරදීම සිදුකරනු ලබන්නේ ගම්වැසියන් පිරිසක් විසිනි.

ආරක්ෂක අංශ මගින් සැකපිට අත්අඩංගුවට ගත් එල්.ටී.ටී.ඊ.යේ සාමාජිකයන් මෙන්ම හමුදාවට භාරවූ තරුණයන් පුනරුත්ථාපනය කිරීම සඳහා පවත්වාගෙන ගිය සංක්‍රාන්ති කඳවුරක් ලෙස බිඳුණුවැව කඳවුර පවත්වාගෙන ගොස් තිබිණි. වැඩි හරියක් එහි රඳවා සිටියේ අවුරුදු 20ට අඩු තරුණයන් සහ බාලවයස්කරුවන්ය. දීර්ඝ කාලයක් තිස්සේ නඩු පැවරීමකින් තොරව රඳවා තබාගැනීමට එරෙහිවත්, තමන්ගේ ඥාතීන්ගෙන් ලැබෙන ලිපි ලේඛන කඳවුරු පාලනාධිකාරිය විසින් හිතාමතාම රඳවා තබාගැනීමට එරෙහිවත් විරෝධතාවක් සහ උපවාසයක් රැඳවූවන් විසින් ආරම්භකරනු ලබන්නේ දින කිහිපයක් තිස්සේය.

තත්ත්වය උණුසුම් මුහුණුවරක් ගන්නේ 2000 ඔක්තෝබර් 24දාය. මෙදින රැඳවූවන් සහ කඳවුරේ ආරක්ෂක නිලධාරීන් අතර බහින්බස් වීමක් ඇතිවන්නේ ආහාර සහ පහසුකම් මුල්කරගෙනය. ඒ අතර කටකතාවක් පැතිර යන්නේ රැඳවියන් විසින් එහි සිටි ආරක්ෂක නිලධාරීන් පවා ප්‍රාණ ඇපකරුවන් ලෙස රඳවා තබාගෙන ඇති බවටය. පැවැති නොසන්සුන් තත්ත්වය පාලනය කිරීමට පසුදින පොලිසිය කැඳවීමට පියවර ගත්තේය. බණ්ඩාරවෙල සහ අවට ප්‍රදේශවාසීන් අතර කඳවුරේ සිටින එල්.ටී.ටී.ඊ. රැඳවූවන් කැරලි ගසා කඳවුරෙන් පැන යාමට සූදානම් වන බවට වූ කටකතාවක් පැතිර යන්නේ ඒත් සමගිනි.

මෙම වකවානුවේදී එල්.ටී.ටී.ඊ. සංවිධානය උතුරේදී හමුදාවට එරෙහිව දරුණු ප්‍රහාර එල්ල කර තිබූ බැවින් රට තුළ නිර්මාණය වී තිබුණේ විශාල ජාතිවාදී සහ වාර්ගික උණුසුමකි. බිඳුණුවැව පුනරුත්ථාපන කඳවුර එම ප්‍රදේශයෙන් ඉවත් කරන ලෙස ඉල්ලා සිංහල සංවිධාන ඊට පෙර සිටම පෝස්ටර් ව්‍යාපාර සහ උද්ඝෝෂණ දියත් කර තිබුණි. මේ සියල්ල සමග කඳවුර තුළ හටගත් උණුසුම් තත්ත්වය හමුවේ ගම්වැසියන් කලබල වන්නේ කටකතාවලට තටුද ලැබෙමිනි. අවසානයේදී සිදුවන්නේ පොලිසිය බලා සිටියදී ගම්වැසියන් අතින් නිරායුධ රැඳවූවන් පිරිසක් ඝාතනය වීමය. තියුණු ආයුධ, පොලු මුගුරු සහ පෙට්‍රල් රැගත් සිය ගණනක මැර පිරිසක් කඳවුරට දෙසට කඩාවැදී එහි සිටි රැඳවූවන් කපා කොටා පහරදී ගිනිතබා මරාදැමුවේ අමු අමුවේය.

මෙහිදී පොලිසියට චෝදනා එල්ලවන්නට වූයේ රැඳවුවන් ආරක්ෂා කිරීමට අපොහොසත් වූ බවටය. පලායෑමට උත්සාහ කළ රැඳවියන්ට වෙඩි තැබූ බවටත් ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම පොලිසියට මෙහිදී චෝදනා එල්ල කළේය.

මෙම සිදුවීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පුද්ගලයන් රැසක් අත්අඩංගුවට ගත්තේය. කොළඹ මහාධිකරණයේ විභාග වූ නඩුවේදී පොලිස් නිලධාරීන් දෙදෙනකු ඇතුළු පස් දෙනකුට මරණ දඬුවමද නියම විය. ඔවුන් ශ්‍රේෂ්ඨාධිකරණට යොමුකළ අභියාචනයෙන් නිදොස් කොට නිදහස් විය. ඒ, ඔවුන්ට එරෙහිව එල්ල වී තිබූ චෝදනා සාධාරණ සැකයකින් තොරව ඔප්පු කිරීමට පැමිණිල්ල අපොහොසත් වී ඇති බව ප්‍රකාශ කරමිනි. ඒ අනුව මරණ දඬුවම නියමවූ සියලු දෙනා 2005 වසරේදී නිදහස ලැබීය. ඒ අනුව එම සිදුවීමට අදාළව කිසිදු පුද්ගලයෙකුට නීතිය හමුවේ දඬුවම් ලැබුණේ නැත.

එවක පැවති චන්ද්‍රිකා ආණ්ඩුවේ බන්ධනාගාර විෂය භාරව සිටි අමාත්‍යවරයා වූයේ ජී.එල්. පීරිස් මහතාය. ඔහු එවකට අධිකරණ හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු අමාත්‍යවරයාය. මෙම සිදුවීමත් සමග කැබිනට් සංශෝධනයක්ද සිදුවිය. එහිදී ජී.එල්. පීරිස් මහතා සතුව පැවති අමාත්‍ය ධුරය හිමිවන්නේ බැටී වීරකෝන් මහතාටය. බන්ධනාගාර විෂය භාර ඇමැතිවරයා එසේ කැබිනට් සංශෝධනයෙන් වෙනසක් සිදුවුවත් ආරක්ෂක අමාත්‍යවරිය වූ ජනපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය සම්බන්ධයෙන් නම් කිසිවක් සිදු නොවීය. කැබිනට් සංශෝධනයක් සිදුවුවා මිස කිසිදු අමාත්‍යවරයකු සදාචාරාත්මක වගකීමක් භාරගෙන සිය ධුරවලින් නම් ඉල්ලා අස්වූයේ නැත.

රුවන් වෙඩිවර්ධන

# ලංකාව ගැන මතය චීනය හදිසියේම වෙනස් කළේ ඇයි?




**චීනයේ ආධාර මත කඩවත-මීරිගම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් 2022 නතර වූයේ ආර්ථික අර්බුදයත් සමගය. ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක චීන ණය සහ ශ්‍රී ලංකා රජයේ ඩොලර් මිලියන 438ක දායකත්වයෙන් අධිවේගී මාර්ගයේ කඩවත-මීරිගම කොටස හදන්න මුලින් එකඟ වී ව්‍යාපෘතියේ ඉදිකිරීම් ආරම්භ විය. 2022 ආර්ථික අර්බුදයත් සමග ඉදිකිරීම් අතරමග නැවතුණි. පසුව 2025 අගෝස්තු මාසයේ ජනාධිපති අනුර පාර්ලිමේන්තුවේදී කියා සිටියේ චීනයේ එක්සිම් බැංකුව සහනදායී ණය ක්‍රමයක් යටතේ මීරිගම-කඩවත අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් යළි ආරම්භ කරන බවය. ඊළඟ කැබිනට් රැස්වීමේදී එම ණය මුදල අනුමත කිරීමට නියමිත බවද ජනාධිපති අනුර පැවැසීය. 2025 අගෝස්තු 18 ජනාධිපති අනුර අධිවේගී මාර්ගයේ වැඩකටයුතු ආරම්භ කරමින් චීනය අගයමින් කතා කළේය. මෙරට චීන තානාපතිද කතා කළේය.**

ජනාධිපති අනුර සහ චීන තානාපති කඩවත-මීරිගම ඉදිකිරීම් ආරම්භ කොට මේ අගෝස්තු මාසයට වසරකි. එහෙත් 2025 අගෝස්තු මාසයේ අධිවේගයේ ඉදිකිරීම් උත්සවශ්‍රීයෙන් ආරම්භ කළ නමුත් කිසිවක් සිදුවූයේ නැත. මෙයට හේතුව ව්‍යාපෘතිය ප්‍රමාද කිරීම නිසා ගෙවිය යුතු දඩය සහ වියදම වැඩි වීම නිසා නව මූල්‍ය ගිවිසුමකට එළඹීමට චීන එක්සිම් බැංකුව සහ ලංකා ආණ්ඩුව අසමත් වීම බව වාර්තා විය. ඒත් චීනයට සමීප ආරංචි මාර්ග කියන්නේ 2025 අගෝස්තු පටන්ගත් ඉදිකිරීම් කඩාකප්පල් වීමට හේතුව චීන පර්යේෂණ නැව්වලට ලංකාවට ඇතුළු වීම සඳහා පනවා ඇති තහනම සම්බන්ධයෙන් ආණ්ඩුව තීරණයක් නොගැනීමෙන් චීනය ලංකාවේ ව්‍යාපෘති සඳහා මන්දගාමී ප්‍රතිපත්තියක් අනුගමනය කරන බවය.

එහෙත් හදිසියේ පසුගිය සතියේ චීන එක්සිම් බැංකු නියෝජිත පිරිසක් ලංකාවට පැමිණ නියෝජ්‍ය මුදල් ඇමැති හමුවී කඩවත - මීරිගම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය යළි ආරම්භ කරන්න එකඟ විය. මේ මස අවසානයේ ඒ සඳහා වූ ගිවිසුම අස්සන් කරන්න චීන එක්සිම් බැංකු නියෝජිත පිරිසක් ඒමට නියමිතය.

ලංකා ආණ්ඩුව තවමත් චීන පර්යේෂණ නැව් තහනම ඉවත් කර නොමැත. එසේ නම් චීනයේ මේ අලුත් වර්ධනය කුමක්ද? චීනය පර්යේෂණ නැව් තහනමේ එල්ලී සිටීමෙන් ඇමෙරිකාව සහ ඉන්දියාව ලංකාවේ සිය බලය ව්‍යාප්ත කිරීම වේගවත් කරන බව චීනයට වැටහුණාද? නැව් තහනම නිසා විවේක ගනිමින් සිටි චීනය ලංකාව තුළ ඇමෙරිකාවේ මෙහෙයුම් දැක යළි භූදේශපාලනික ගේම් එකට සූදානම් වෙනවාද?

# ගිරිනුවර කන්ද මුදුනේ මහ රූ ගල්ගුහාවක හමුවූ ලංකාවේ කඳු නගින්නා




**ස්වභාවධර්මයත් එක්ක ගනුදෙනු කරන මිනිස්සු ඒ හා බැඳෙන්න තමන්ටම ආවේණික ක්‍රම හොයා ගන්නවා. ඒවා විවිධාකාරයි. එකිනෙකට වෙනස්. සමහර ඒවා අද්භූතයි, ගුප්තයි, අභියෝගාත්මකයි. ඒ මොන ක්‍රමයක් වුණත් ඒවා ස්වභාවධර්මය එක්ක අනුගතයි. කඳු නැගීම කියන්නෙත් අන්න එහෙම දෙයක්. විදේශ රටවල නම් hiking කියලා කියනවා. අපේ රටේ කඳු නැගීම එතරම් ප්‍රචලිත නොවුණත්, තනි පුද්ගලයන් වශයෙන්, ඒ කියන්නේ solo hikersලා හා කණ්ඩායම් වශයෙන් මෑත කාලයේදී යම්තාක් දුරකට කඳු නැගීම ප්‍රචලිත වෙමින් පවතිනවා. Solo hiker කෙනෙක් විදියට දශකයක පමණ කාලයක් මෙරට ගිරි මුදුන් තරණය කළ, ස්වභාවධර්මයට ළැදි තරුණයෙක් 'කැලෑ කොලමේ' මට ගිරිනුවර කඳු මුදුනේ ඉතිහාසයේ පුරාවෘත්ත රැසකට උරුමකම් කියන ගල්ලෙනක් තුළදී මුණගැහුණා. ඒ, අකලංක රණසිංහ සහෘදයා. අද අපි කැලෑ කොලමෙන් ලෑස්ති වෙන්නේ ඔහුගේ කඳු නැගීමේ කලාවේ රසබර තැන් දැනගැනීම සඳහායි.**

අද අපි 'කැලෑ කොලම' පටන් ගන්න යන්නේ අමුතුම කතන්දරයකින්. කැලි කැපිය හැකි අඳුරක මහා කන්දක ගල් ගුහාවක් ඇතුළේ යන්තම් ගිනි මැලයක එළියකින් මුහුණ පේන ස්ථානයක සිට. ඒ ස්ථානය තමයි අම්පාර පොල්ලෙබැද්ද ග්‍රාමයේ තියෙන ඓතිහාසික පුරාවෘත්ත රැසකට උරුමකම් කියන නුවරගල කන්දේ ගල් ගුහාව. අපේ කතාවේ කතානායකයා අද ලංකාවේ 'හයිකින්' එහෙම නැත්නම් 'සෝලෝ හයිකින්' හෙවත් තනියෙන් කඳු නැගීම තමන්ගේ විනෝදාංශය කරගත් අකලංක රණසිංහ මල්ලි.

**අකලංක මල්ලි මම ඉස්සෙල්ලාම ඔයාව 'කැලෑ කොලම'ට ආයුබෝවන් කියලා පිළිගන්නවා. කියන්නකෝ ඔයාගේ මේ කඳු නැගීමේ කලාව කොහොමද ඉස්සෙල්ලාම පටන් ගත්තේ කියලා.**

ඉස්සෙල්ලාම මම කඳු නගින්න පටන් ගත්තේ 2016 මාර්තු. මගේ පළමුවැනි හයික් එක විදියට මම යන්නේ නකල්ස්වල ගොම්බානියට. ඒ කියන්නේ නකල්ස්වල තියෙන උසම තැන. එතැනින් එහාට 'යකුන්ගේ හෙළ' කියලා තැනක් තියෙනවා. එතැනට තමයි ඇත්තටම මම යන්නේ සෝලෝ නෙමෙයි, මගේ යාළුවෝ සහ තව හත්අට දෙනෙක් එක්ක යන්නේ. මම හයිකින් පටන් ගත්තේ එතැනින්.

**ලංකාවේ තාම හයිකින් කියන එක විනෝදාංශයක් හැටියට කෙරෙනවා මිසක් වෘත්තීය මට්ටමෙන් ඒක කෙරෙනවා අඩුයි. හැබැයි දැන් මෑත කාලයේදී අපි දැකලා තියෙන දෙයක් තමයි විශේෂයෙන්ම තරුණ තරුණියෝ තනියෙන් හයික් කරන්න යන එක. ඒ ගැන ඔබේ අදහස මොකක්ද?**

තරුණ තරුණියෝ ඇත්තටම ස්වභාවධර්මයට මෙහෙම එකතු වෙන එක හොඳයි. ප්‍රොෆෙෂනල් ලෙවල් එකේ වේවා, විනෝදාංශයක් විදියට හෝ වේවා ස්වභාවධර්මයත් එක්ක එකතු වෙන එක ඇත්තටම හොඳයි. ඒකේ කිසිම වරදක් නැහැ. හැබැයි මේ දේවල් ඒ විදියටම පරිස්සම් කරලා, රැකබලාගෙන ඒ දේවල් අනාගත පරපුරටත් ඉතුරු කරලා තමන්ගේ කටයුත්ත කරන එක තමයි හොඳම දේ.

**අපි හයික් එකක් කරන කොට දැනගත යුතු මූලික දේවල් තියෙනවා. ඒ වගේ දේවල් ගැන ඔබේ අත්දැකීම් අනුව මොකක්ද කියන්න තියෙන්නේ?**

අනිවාර්යයෙන්ම. ඒ කියන්නේ අපි හයික් එකක් යනවා නම් ඒකට පෙර සූදානමක් තියෙන්නම ඕනේ. ඒ කියන්නේ අපි නුවරගලම ගමුකෝ. අපි නුවරගල තැනට එනවා නම් අපි ඉස්සෙල්ලාම ඒ ගැන හොඳ අධ්‍යයනයක් කරන්න ඕනේ. මොකද නුවරගල කියන්නේ අලි, කොටි, වලස්සුන්ගෙන් පිරිච්ච මහා කැලෑවක්. එතකොට ඒ වගේ කැලේකට එද්දී විශේෂයෙන් කොටි වලස්සු හම්බ වුණේ නැතත් අලි අනිවාර්යයෙන්ම අපිට හම්බ වෙනවා. අලි ගැන විශේෂ දැනුමක් තියෙන්න ඕනේ නැහැ, හැබැයි අපි ආරක්ෂා වෙන්න අවශ්‍ය හැමදේම දැනගෙන ඉන්න ඕනේ. ඊට අමතරව අපි කොහේ ගියත් අපිට අවශ්‍ය බෙහෙත්, වතුර, ආහාර ඇතුළු සියලු දේ සහිත බැක් පැක් එක අපිට උස්සගෙන යන්න පුළුවන් විදියට ඒක සකස් කරගන්න ඕනේ. ඒකෙදි අපිට අත්‍යාවශ්‍යම බඩු ටික විතරක් අරගෙන, අනිත් දේවල් ගොඩාක් දුරට අඩු කරලා, අපිට කන්ද උඩකදී, කෑම්පින් එකකදී ඕනෙම දේවල් ටික විතරක් අරන් යන්න අපි වගබලා ගන්න ඕනේ. ඊට අමතරව හයික් එකකදී තමන්ගේ ෆිට්නස් ගැන, තමන්ට ලෙඩ තියෙනවා නම් ඒ ගැන සැලකිලිමත් වෙන්න ඕනේ. මොකද අපි යන්නේ කැලෑවක. තමන්ගේ ආරක්ෂාව සලසා ගන්න පුළුවන් නම්, ඒකට ආත්ම ශක්තියක් තියෙනවා නම් හයික් එකක් ගියාට කමක් නැහැ.

**මම අහලා තියෙනවා සමහර හයිකින් යන කණ්ඩායම් නිසා ඇතැම් හයිකින් ගමනාන්ත මේ වෙනකොට තහනම් වෙලා තියෙනවා. ඒක හොඳ පූර්වාදර්ශයක් නෙමෙයි ඉස්සරහට හයිකින් යන්න බලාපොරොත්තු වෙන අයට. අත්දැකීම් තියෙන පරිණත හයිකර් කෙනෙක් හැටියට ඔබට ඒ ගැන මොකක්ද කියන්න පුළුවන්?**

ඇත්තටම දැන් ලංකාවේ අපේ භාෂාවෙන් කිව්වොත් 'රැල්ලට යනවා' කියලා දෙයක් තියෙනවා. එක තැනක් කොහෙන් හරි වයිරල් ගියොත් අපි ඒ තැනට යන්න පුරුදු වෙලා ඉන්නවා. ඊට පස්සේ ලොකු අය හෝ වේවා පොඩි අය හෝ වේවා එතැනට ගිහිල්ලා කාලා බීලා විනෝද වෙනවා. ඒක නෙමෙයි ඇත්තටම ප්‍රශ්නය. අපි එතැනට ගෙනියන දේවල් ආපහු ගේන්න දැනගන්න ඕනේ. අපි කවුරුත් ඒ තැන විනාශ නොකර නැවත එන්න වගබලා ගන්නාතුරු ලංකාවේ තව ගොඩක් තැන් ඔය විදියටම තහනම් වෙයි මගේ මතය විදියට මේ යන විදියට ගියොත්. මම යන කිසිම තැනකදි මම නම් ටොෆි කොළයක්වත් දාලා එන්නේ නැහැ. ඒ ටික අපි අනිවාර්යයෙන් නැවත අරන් එනවා. නමුත් දැන් ඉන්න හයිකින් කරන බොහෝ අය තමන් රැගෙන යන ගොඩක් දේවල් දාලා එනවා. ප්ලාස්ටික් බෝතල්, බියර් ටින් ඒ හැමදේම. ඒක නොවෙන්න වගබලා ගත්තේ නැත්නම් නුදුරේදීම අපිට ලංකාවේ ලස්සන තැන්, සුන්දර තැන් ගොඩක් මගහැරෙන්න ඉඩ තියෙනවා.

**සංචාරක කර්මාන්තය දියුණු කරන්න මේ ලංකාවේ තියෙන මේ hiking destination එහෙම නැත්නම් කඳුකර ගමනාන්ත තවදුරටත් රාජ්‍ය අනුග්‍රහය හෝ පුද්ගලික අනුග්‍රහය ඇතිව දියුණු කරන්න ඕනේ කියලා ඔබට හිතෙන්නේ නැද්ද?**

අනිවාර්යයෙන්ම. රාජ්‍ය අනුග්‍රහයක් එක්කම මේක දියුණු වෙන්න ඕනේ. මේ තැන් තහනම් කරන එක නෙමෙයි වෙන්න ඕනේ. හරි පරිපාලනයක් එක්ක ඒවාට යනවා නම්, ඒ විදියට ගිහිල්ලා ආපහු එන්නේ කොහොමද, ඒවා ආරක්ෂා කරන්නේ කොහොමද කියලා එයාලට මොකක් හරි මාර්ගෝපදේශයක් දෙන්න ඕනේ. උදාහරණයක් විදියට මේ මේ දේවල් ගෙනියන්න බැහැ, අරන් ගියොත් ඒ දේවල් නැවත ගේන්න ඕනේ වගේ. අන්න ඒ වගේ දෙයක් රාජ්‍ය අනුග්‍රහයක් හෝ පෞද්ගලික ආයතනයක් හරහා හෝ සිදුවිය යුතුයි. ඒ වගේම එය නීතියක් බවට පත්කරලා ඒ නීති කඩකරන අයට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමත් අත්‍යාවශ්‍යයි.

සමන් හල්ලොලුව

Dialog Pay
Now Available at 100,000+ Outlets




# DIALOG වෙතින් ගනුදෙනු පහසු කරන්න DIALOG PAY

ශ්‍රී ලංකාවේ අංක 1 සන්නිවේදන සම්පාදකයා වන ඩයලොග් ආසිආටා පීඑල්සී, මෙරට ජනතාවගේ ජීවිතවලට, ඩිජිටල් ගෙවීමේ ක්‍රම සමීප කිරීමේ සුවිශේෂී පියවරක් ලෙස, MyDialog App හරහා දුරකතන සේවා, බැංකු කටයුතු හා අනෙකුත් ගෙවීම් එකම ඩිජිටල් පද්ධතියකට රැගෙන එමින්, Dialog Pay හඳුන්වාදුන් බව සතුටින් දැනුම්දෙන ලදී. ශ්‍රී ලංකා රජය විසින් මෑතකදී දියත් කරන ලද LankaQR ගෙවීම් ක්‍රමය ප්‍රචලිත කිරීමේ ජාතික වැඩසටහනට සමගාමීව, ඩිජිටල් ගෙවීම් ක්‍රමවේද ජනගත කිරීම වේගවත් කිරීමෙන්, ඩිජිටල් ආර්ථිකයක් ගොඩනැගීම, Dialog Pay හඳුන්වාදීමේ ප්‍රධාන අරමුණයි. මේ ඔස්සේ ශ්‍රී ලාංකික පාරිභෝගිකයන්ට, ඩිජිටල් ගෙවීම් ක්‍රමවේද එදිනෙදා ජීවිතයේ සාමාන්‍ය පුරුද්දක් ලෙස එක්කිරීම දිරිගන්වමින්, ඉතා පහසු හා සරල ලෙස ඩිජිටල් ගනුදෙනු සිදුකිරීමටත් ඒ ඔස්සේ Data වාසිද ලබාගැනීමටත් අවස්ථාව සලසා ඇත.

ශ්‍රී ලංකාවේ ඩිජිටල් තාක්ෂණයෙන් බලගැන්වූ සුවිශාල වෙළෙඳ ජාලයක් පදනම් කරගනිමින් ක්‍රියාත්මක වන Dialog Pay, රට පුරා නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල වෙළෙඳසල් 100,000කට අධික ප්‍රමාණයකදී පාරිභෝගිකයන්ට ඉතා ආරක්ෂිතව, වඩාත් පහසුවෙන් LankaQR ගෙවීම් සිදුකිරීමේ හැකියාව පිරිනමයි. ඒ අනුව පාරිභෝගිකයන්ට, සුපිරි වෙළෙඳසල්, ආපනශාලා, ඇඳුම් පැළඳුම් හා විදුලි උපකරණ අලෙවිසල්, රෝහල් සහ සාමාන්‍ය අලෙවිසල් ඇතුළු ස්ථාන රාශියකින් ඔවුන් ලබාගන්නා භාණ්ඩ හෝ සේවාවන් සඳහා, පහසුවෙන්ම QR කේතය Scan කර, මුදල් ගෙවිය හැක. මෙය රට පුරා ව්‍යාපාරවලටද, ශීඝ්‍රයෙන් වර්ධනය වන ශ්‍රී ලාංකීය ඩිජිටල් ආර්ථිකය වෙනුවෙන් තම සක්‍රිය දායකත්වය ලබාදීමට හැකියාව සලසන විසඳුමකි.

මේ සමග Genie, එහි නවතම වෙළෙඳ නාමය වන, Dialog Pay ලෙස නව්‍යකරණය වේ. දුරකතන සේවා, බැංකු කටයුතු හා අනෙකුත් ගෙවීම් ඒකාබද්ධ වූ පුළුල් ඩිජිටල් පද්ධතියක් දක්වා සමාගම ලබා ඇති සුවිශාල පරිණාමය පෙන්නුම් කරන, Dialog Pay මගින් පාරිභෝගිකයන්ට, දැන් තම අවශ්‍යතා රැසක් ඒ හරහා ඉටුකර ගතහැක. ඒ අනුව, Dialog Pay App සහ MyDialog App හරහා පාරිභෝගිකයන්ට තම eZ Cash ගිණුම භාවිත කර හෝ තමන් කැමැති බැංකු ගිණුමක් ඊට එක් කිරීම මගින්, ඉතා පහසුවෙන් Dialog Pay භාවිත කළ හැක. එමගින්, LankaQR හරහා මුදල් ගෙවීමද, වෙනත් ගිණුමකට මුදල් යැවීමද පහසුවෙන්ම කළ හැකි වේ. එමෙන්ම, ඉතුරුම් ගිණුම් සහ ස්ථාවර තැන්පතු ගිණුම් විවෘත කිරීමේ පහසුවත් මෙමගින් සලසාදී ඇති අතර, Dialog Finance මගින් ණය පහසුකම් ලබාගැනීමටද මෙය භාවිත කළ හැක. ශ්‍රී ලාංකික පාරිභෝගිකයන් දිනපතා තම ඩිජිටල් මුදල් ගෙවීමේ කටයුතු සඳහා Dialog Pay භාවිත කිරීම දිරිගැන්වීමේ අරමුණෙන් ඒ හරහා සිදුකරන QR ගෙවීම් සඳහා ඩයලොග් වෙතින් නොමිලේ Data වාසිද හිමි වේ. පාරිභෝගිකයන්ට ඩිජිටල් මුදල් ගෙවීම් වෙත පහසුවෙන්ම යොමුවී, නිරන්තරයෙන් ඒ හරහා ගනුදෙනු කිරීමටත්, ඩිජිටල් මුදල් ගෙවීම් ඔවුන්ගේ දිගුකාලීන ජීවන පුරුද්දක් බවට පත්කරගැනීමටත් එමගින් දිරිගන්වනු ලබයි.






## මහජන බැංකුව

# සිය අභිමානවත් 65 වැනි සංවත්සරය සමරයි









**මහජන බැංකුව ස්ථාපිත කර ජූලි 01 වැනි දිනට 65 වසරක් සැපිරිණි. ඒ නිමිත්තෙන් විශේෂ උත්සවයක් කොළඹ 02, People's Tower හිදී පැවැත්විණි.**

මහජන බැංකුවේ සභාපති මහාචාර්ය නාරද ප්‍රනාන්දු හා ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී ක්ලයිව් ෆොන්සේකා යන මහත්වරුන් මෙහිදී කාර්ය මණ්ඩලය අමතන ලදී. මීට අමතරව 'ආර්ථික විමසුම' සඟරාවේ නවතම කලාපයද එළිදැක්විණි.

එමෙන්ම 65 වැනි සංවත්සරය නිමිත්තෙන් රටට, ජනතාවට, ගනුදෙනුකාර භවතුන්ට මෙන්ම මහජන බැංකුව පිහිටුවීමේලා පුරෝගාමී වූ සියලු නායකයන්ට, අතීත සහ වත්මන් කාර්ය මණ්ඩලයට ආශීර්වාද පතා සර්ව ආගමික වැඩසටහන් මාලාවක්ද පැවැත්විණි.

ඒ අනුව, මහජන බැංකු බෞද්ධ සංගමය සංවිධාන කළ මහා පුණ්‍යෝත්සවය ජූලි මස 03 සහ ජූලි මස 04 දෙදින තුළ පැවැත්විණි. මේ යටතේ ජූලි මස 03 දින සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනයක්ද, පසුදින මහා සංඝරත්නය හැටපස් නමක් විෂයෙහි සපිරිකර දානමය පින්කමක්ද පැවැත්විණි.

එමෙන්ම මහජන බැංකු හින්දු සංගමය, මුස්ලිම් මජ්ලීසය හා කිතුනු එකතුව සංවිධාන කළ ආගමික වැඩසටහනක්ද පැවැත්විණි.

මේ අවස්ථාවන්ට මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්, ආයතනික හා විධායක කළමනාකාරීත්වය සහ බැංකු කාර්ය මණ්ඩලයද සහභාගි විය.











# තලපති උතුර අතට ගනී

රාජ්‍ය රහස්



## උතුරෙන් තමිල්නාඩුවට

**තමිල්නාඩුවේ මහජන විප්ලවයකින් බලය අල්ලා මහඇමතිධුරයට පත්වූ සුපිරි නළු තලපති විජේ පිළිබඳව දෙව විවිධ අප 'රාජ්‍ය රහස්' තීරයේ ගිය සතියේ විශේෂ අනාවරණයක් කරමින් ගිය සතියේ ඉදිරි කාල වකවානුවේදී ලංකාවේ දේශපාලනය සම්බන්ධයෙන් තලපති විජේ තීරණාත්මක චරිතයක් වනු ඇති බවය.**

එහිදී අප වැඩිදුරටත් කියා සිටියේ තලපති විජේගේ දේශපාලන ආගමනයත් සමඟ ලංකාවට බරපතළ සිදුවීම් ගණනාවකට මුහුණ දීමට සිදුවනු ඇති බවකි. අප කළ එම අනාවරණය මුළු අදියරේදීම තහවුරු කරමින් බලයට පත්වී සති දෙකකට පමණක පසු උතුරේ ජනතාව වෙල්ලමුල්ලිවයික්කාල් පැවැති අවසන් සටනේදී මියගිය එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් සිහි කරමින් පැවැත්වූ මහ වීර සැමරුම් දිනය නිමිති කොටගෙන තලපති විජේ විශේෂ නිවේදනයක් නිකුත් කිරීමට පියවර ගත්තේය. සිය නිවේදනය මඟින් ඔහු මහ වීර සැමරුම් පත්‍රිකාව අනුව අදහස් දක්වා තිබූ ආකාරයත් දැකගත හැකි විය.

ඒ සමඟම කිහිපවතාවක් බලාපොරොත්තු නොවූ ආකාරයේ තවත් සිදුවීමක් සිදුවිය. ඒ, උතුරේ මන්ත්‍රීවරයකු ලෙස පළමු වරට පාර්ලිමේන්තුවට තේරීපත් වූ ආනන්දෝලනාත්මක චරිතයක් වන අර්චුනා රාමනාදන් හමුවීමෙන් චෙන්නායි නුවරට ගොස් තලපති විජේ හමුවීමට උත්සාහ කිරීමය. සාමාන්‍යයෙන් අර්චුනා සැලකෙන්නේ පාර්ලිමේන්තුවෙහි සිටිනදී පමණක් නොව, පාර්ලිමේන්තුව තුළදීත් එල්.ටී.ටී.ඊ. සංවිධානයට සහ එහි නායක ප්‍රභාකරන්ට පක්ෂපාති ආකාරයට අදහස් දක්වන මන්ත්‍රීවරයෙකු ලෙසටය. තලපති විජේද එල්.ටී.ටී.ඊ. සංවිධානයට සහ ප්‍රභාකරන්ට අතිශය සමීප පුද්ගලයකු ලෙස සැලකේ. ඒ අනුව ඔහුගෙන් දෙකා අර්චුනා සහ තලපති විජේ අතර හමුවක් සිදුවනු ඇති බව සිතා සිටියත් එවැන්නක් සිදු නොවීම විශේෂ සිද්ධියකි. ඊට හේතු වූයේ අර්චුනා තලපති විජේ හමුවීමේ අපේක්ෂාවෙන් චෙන්නායිහි රැඳී සිටියද ඒ සඳහා කාලවේලාව වෙන් කිරීමට තලපති විජේ කටයුතු නොකිරීමය. ඒ අනුව සියල්ලන්ටම පැහැදිලි වූ කරුණක් වූයේ එල්.ටී.ටී.ඊ. හිතවාදී වුවා සියා තලපති විජේගෙන් කිසිවකුට පිළිග ැනීමක් නොලැබෙන බවය. එමෙන්ම ඉන් තලපති විජේ ලබාදුන් සංඥාව වූයේ නිකන් අවටට සියාට හිටිහටයේ උතුරෙන් මතුවන දේශපාලන චරිතවලට තලපති විජේගෙන් පිළිගැනීමක් නොලැබෙන බවය. ඒ අනුව බොහෝ දෙනා සිතා සිටියේ අනුමුවේ ප්‍රභාකරන් ගැන කතා කරන, අනුමුවේ ඊළාම් රාජ්‍යයක් ගැන කතා කරන අර්චුනා වැන්නෙකුට පවා තලපති විජේගෙන් කිසිදු අවස්ථාවක් නොලැබෙන වාතාවරණයක් යටතේ තලපති විජේ ඇතැම් දේශපාලනඥයන් මෙන්ම බලයට පැමිණි පසු ලංකාව සම්බන්ධයෙන් කතා කිරීම සහ ප්‍රතිචාර දැක්වීම අතහැර දමා ඇතැයි කියාය.

නමුත් අර්චුනාගේ ඉල්ලීමට ප්‍රතිචාර නොදැක්වූ තලපති විජේ, පසුගිය සතියේ සිය සිතතියටවල චෙඩියකට විශේෂත ප්‍රධාන තළවක මෙන් සියල්ලන්ම බරපතළ සංදේශක් ලබාදෙමින් ලංකාවේ දේශපාලන ජේමට නැවත වතාවක් එක්වීර වූ ආකාරයක් දැකගත හැකි විය. ඒ තලපති විජේ ඇතුව ජූලි මස 03 වැනි දින, දෙමළ ඊළාම්වාදයට සහ එල්.ටී.ටී.ඊ. සංවිධානයට අතිශය පක්ෂපාතීව කටයුතු කළ දෙමළ දේශපාලන නායකයකු වූ කුමාර් පොන්නම්බලම්ගේ පුත්‍රයා වන පාර්ලිමේන්තු මන්ත්‍රී ගජේන්ද්‍රන් පොන්නම්බලම් හමුවීමට පියවර ගැනීමත් සමඟය. මෙම හමුව සිදුවූයේ ගජේන්ද්‍රන් තලපති විජේ බලයට පත්වීමෙන් පසු උතුරේ දේශපාලන ප්‍රශ්න සම්බන්ධයෙන් සහ උතුරු නැගෙනහිර දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට අවශ්‍ය බව දැනුම් දෙමින් කර තිබූ ඉල්ලීමකට අනුවය. ඒ අනුව, ගජේන්ද්‍රන් පොන්නම්බලම් තවත් උතුරේ දේශපාලන නායකයන් කිහිප දෙනකු සමඟ චෙන්නායි බලා කිසිදු ප්‍රසිද්ධියකින් තොරවම පිටත්ව යෑමට කටයුතු කොට තිබිණි.

## ගමන ලීක් වෙයි

**කෙසේ වෙතත් කිසිදු ප්‍රසිද්ධියකින් තොරව ගජේන්ද්‍රන් ඇතුළු කණ්ඩායම තලපති විජේ හමුවීමට චෙන්නායි බලා පිටත්ව තිබුණද, විජේ සහ ගජේන්ද්‍රන් අතර සාකච්ඡාවක් පැවැත්වීම තලපති විජේගේ කාර්යාලය මඟින් තහවුරු කරද්දීම ඒ සම්බන්ධයෙන් වූ තොරතුරු තමිල්නාඩුවේ චෙන්නායි නුවර සිටින ශ්‍රී ලංකාවේ නියෝජ්‍ය මහකොමසාරිස්වරයා වූ ආචාර්ය ගණේෂනාදන් ගේතීස්වරන් මහතාට දැනගන්නට ලැබිණි.**

එම තොරතුරු වාර්තා විමත් සමඟ තලපති විජේ සහ ගජේන්ද්‍රන් අතර හමුවට දින 3ක් තබා, එනම් ජූලි 01 වැනි දින ශ්‍රී ලංකාවේ නියෝජ්‍ය මහකොමසාරිස් ගණේෂනාදන් මහතා නිල වශයෙන් තලපති විජේ හමුවීමට පියවර ගත්තේය. එය මාධ්‍යයට නිකුත් වූයේ තලපති විජේගේ ජයග්‍රහණයට සුබ පැතීම සඳහා ශ්‍රී ලංකාවේ නියෝජ්‍ය මහකොමසාරිස්වරයා ඔහුව හමුවූ බවකි. නමුත් අප ඇති තොරතුරුවලින් තම කියැවෙන්නේ තලපති විජේගේ කාර්යාලය මඟින් ගජේන්ද්‍රන්ගේ රැස්වීම තහවුරු කිරීමත් සමඟ කලබලයට පත්වූ චෙන්නායිහි පිහිටි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් මෙසේ තලපති විජේව හමුවීමට හදිසියේම ගොස් ඇති බවකි.

කෙසේ වෙතත් මෙම සාකච්ඡාවේදී ලංකාවේ දේශපාලනයට සම්බන්ධ කිසිදු සාකච්ඡාවක් සිදුව නැති බවද 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය. ශ්‍රී ලංකාවේ නියෝජ්‍ය මහකොමසාරිස්වරයා තලපති විජේ මුණගැසී මුලින්ම සිය සුබපැතුම් එක්කොට, පසුව ලංකා ආණ්ඩුව එවා තිබූ විශේෂ සුබපැතුම් පණිවුඩය තලපති විජේට එක්කොට, තමිල්නාඩු ආණ්ඩුවටත් ලබාදීමට පියවර ගෙන තිබිණි. මීට අමතරව තමිල්නාඩුව සහ ලංකාව අතර දේශපාලන නොවන සබඳතා වැඩිදියුණු කරගන්නා ආකාරය පිළිබඳවද මේ දෙදෙනා අතර අදහස් හුවමාරු වී තිබූ බවක් 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය. කෙසේ වෙතත් මෙම හමුව නිසි හමුවීම හරහා තලපති විජේ සහ ගජේන්ද්‍රන්ලාගේ හමුව සම්බන්ධයෙන් ආණ්ඩුවේ පිරිස් කිසියම් කලබලයට පත්ව තිබූ ආකාරයක් දැකගත හැකි විය.

ඉන් අනතුරුව පසුගිය 03 වැනිදා පැවැති තලපති විජේ සහ ගජේන්ද්‍රන් අතර වූ සාකච්ඡාවට ඉහළ ප්‍රසිද්ධියක් ලබාදීමට ඉන්දීය මාධ්‍ය කටයුතු කර තිබූ ආකාරයක් දැකගත හැකි විය. එය තමිල්නාඩු මහඇමතිවරයා ලෙස තලපති විජේ බලයට පත්වීමෙන් පසු ශ්‍රී ලංකාවේ දේශපාලනඥයකු සමඟ පැවැත්වූ පළමු දේශපාලන සාකච්ඡාව ලෙස වාර්තා පොත් ආකාර එක්විය. මෙහිදී පළමු වතාවට තලපති විජේ සහ ගජේන්ද්‍රන් අතර ලංකාවේ තත්ත්වය පිළිබඳ විශේෂ අදහස් හුවමාරුවක් සිදුවූ ආකාරයක් දැකගත හැකි විය.

ඒ අනුව තලපති විජේ සහ ගජේන්ද්‍රන් ඇතුළු උතුරෙන් ගිය දේශපාලන නායකයන් අතර සාකච්ඡාවේ ඇත්තේ ලක්වූයේ මොනවාද? ඒ සම්බන්ධයෙන් කෙසා බලද්දී අප හට දැනගන්නට ලැබුණේ මෙහිදී උතුරු නැගෙනහිර සම්බන්ධයෙන් බරපතළ කරුණු ගණනාවක් දෙපාර්ශ්වය අතර සාකච්ඡා වී ඇති බවකි.

මෙහිදී පළමුවෙන්ම සාකච්ඡාවට ලක්ව ඇත්තේ උතුරු නැගෙනහිර ජනතාවගේ මානව හිමිකම් උල්ලංඝනය වීම් සම්බන්ධයෙනි. පසුගිය කාලවකවානුවේ පමණක් නොව, යුද්ධය පැවැති කාලසීමාවේදී සිදුවූ මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ සිදුවීම් සම්බන්ධයෙන් එහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා වී ඇති බවක් ආරංචිය.

සාකච්ඡාවේ මීළඟ කොටස ලෙස ලක්ව ඇත්තේ ඉන් අනතුරුවය. එහිදී තලපති විජේට ගජේන්ද්‍රන් දැනුම් දී ඇත්තේ සිය පියා වූ කුමාර් පොන්නම්බලම්ගේ කාලයේ සිටම උතුරු නැගෙනහිර වාර්ගික ප්‍රශ්නයට විසඳුමක් ලෙස ෆෙඩරල් පාලන ක්‍රමයක් පිහිටුවීම අරමුණු කොටගෙන තිබූ බවය. ඒකීය රාජ්‍යයක් යටතේ කිසිදු දිනෙක උතුරු නැගෙනහිර වාර්ගික ප්‍රශ්නයට විසඳුමක් සෙවිය නොහැකි බව මෙහිදී තලපති විජේට සඳහන් දුන් ගජේන්ද්‍රන්, උතුරු නැගෙනහිර ජනතාවට සියලු කොන්දේසි සිදුවන්නේ දැනට ඇති ඒකීය ව්‍යවස්ථාව හේතුකොට ගෙන බවද පෙන්වා දුන්නේය. ඒ අනුව, උතුරු නැගෙනහිර ප්‍රශ්නයට විසඳුම ඊළාම් රාජ්‍යයක් පිහිටුවීම නොවන්නේ නම් ඊට ඇති හොඳම විසඳුම ෆෙඩරල් රාජ්‍ය සංකල්පය බව තලපති විජේට පෙන්වා දුන් ගජේන්ද්‍රන් එය ජනතාවගේ පවා මේ වනවිට පිළිගෙන ඇති බවත් විජේට පෙන්වා දුන්නේය. ඒ හරහා උතුරු නැගෙනහිර දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් සහ ස්වෛරීත්වය තහවුරු කළ හැකි බවද ගජේන්ද්‍රන් එහිදී තලපති විජේට දැනුම් දී සිටියේය.

ඉන් අනතුරුව සාකච්ඡාවේ වැඩි වේලාවක් වෙන්වූයේ මුල්ලිවයික්කාල් අවසන් සටන පිළිබඳ සාකච්ඡා කිරීමටය. මෙහිදී ගජේන්ද්‍රන් ඇතුළු කණ්ඩායම් කල් තියාම ලකලැයිස්තු වී සාකච්ඡාවට ප්‍රවිශ්ට වී තිබූ ආකාරයක් දැකගත හැකි වූයේ මුල්ලිවයික්කාල් අවසන් සටනේදී මෙහෙයුම අනාවරණ වී ගොස්වුණු සාක්ෂි රැසක්ද තලපති විජේට ලබාදීමට ගජේන්ද්‍රන් ඇතුළු කණ්ඩායම කටයුතු කිරීමත් සමඟය. එහිදී විශාල මිනිස් සංහාරයක් සිදුවූ බවත්, එය මේ වනවිට ජාත්‍යන්තරය පවා පිළිගෙන ඇති බවත් තලපති විජේට පෙන්වා දුන් ගජේන්ද්‍රන් පොන්නම්බලම්, අද වනවිට උතුරු නැගෙනහිර දෙමළ ජනතාව සිදුවන අසාධාරණකම් පිළිබඳ ජාත්‍යන්තරය තුළ හඩක් නැඟීමට හරිහමන් දෙමළ නායකත්වයක් නොමැති බවත්, එම නිසා ඊට නායකත්වය ලබාදෙන ලෙසත් තලපති විජේගෙන් ඉල්ලා සිටීමට පියවර ගත්තේය. එහිදී ගජේන්ද්‍රන් විශේෂයෙන් තලපති විජේගෙන් ඉල්ලා සිටියේ මුල්ලිවයික්කාල් අවසන් සටන සම්බන්ධයෙන් ජාත්‍යන්තර මැදිහත් වීමෙන් ස්වාධීන පරීක්ෂණයක් සිදුකිරීම අත්‍යවශ්‍ය බවත්, සමස්ත දෙමළ ජනතාව එම ස්ථාවරයේ සිටින බවත්ය. ඒ සඳහා තලපති විජේගේ නායකත්වය, දායකත්වය, මෙහෙයවීම අත්‍යවශ්‍ය බවද මෙහිදී ගජේන්ද්‍රන් ඇතුළු පිරිස තලපති විජේට දැනුම් දී සිටියේය.

ඉන් අනතුරුව තලපති විජේ ඉන්දියාවටත්, ශ්‍රී ලංකාවටත් මැදහත තවත් අතිශය වැදගත් කාරණාවක් පිළිබඳ ගජේන්ද්‍රන් ඇතුළු කණ්ඩායම සමඟ සාකච්ඡා කිරීමට පියවර ගත්තේය. ඒ, කච්චතිවු දූපත සහ ධීවරයන්ගේ ප්‍රශ්නය පිළිබඳවය. එහිදී තලපති විජේ දීර්ඝ වශයෙන් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළ අතර, උතුරේ ධීවරයන්ගේ ප්‍රශ්නයටද එහිදී විශේෂ අවධානයක් යොමුවිය.

අවසන් වශයෙන් දෙපාර්ශ්වය අතර සාකච්ඡාවට ලක්වූයේ පසුගිය යුද සමයේදී ලංකාවෙන් පලාගොස් තමිල්නාඩුවේ සරණාගතයන් වශයෙන් ජීවත් වන උතුරු නැගෙනහිර දෙමළ ජනතාව සම්බන්ධයෙනි. මේ වනවිට යුද්ධය අවසන් වී වසර 18කට ආසන්න කාලයක් ගතවී ඇති බැවින් මෙම දෙමළ ජනතාව නැවත උතුරු නැගෙනහිර සිය ගම්බිම්වල පදිංචි කරවීමට පියවර ගතයුතු බවද මෙහිදී ගජේන්ද්‍රන් ඇතුළු කණ්ඩායම තලපති විජේට දැනුම් දී සිටියේය. ඒ සම්බන්ධයෙන් තමන් සිය අවධානය යොමුකරන බවද මෙහිදී තලපති විජේ ගජේන්ද්‍රන් ඇතුළු කණ්ඩායමට පොරොන්දුවක් දී තිබිණි. ඒ අනුව, ගජේන්ද්‍රන් ඇතුළු කණ්ඩායම නැවත ලංකාවට පැමිණියේ තලපති විජේ හමුවූ ලංකාවේ පළමු පක්ෂ නායකයන් ලෙසට වාර්තාගත තබමිනි. ඒ අනුව මෙම සාකච්ඡාවේ සම්බන්ධයෙන් තලපති විජේ දක්වන ප්‍රතිචාරය කුමක් වනු ඇද්ද යන්න දැනගැනීමට තවත් ටික කාලයක් බලා සිටීමට සිදුවනු ඇත.

## සජිත් නීතිඥ සංගමයට ලියයි

**විවිධ දේශපාලන කාරණා මුල්කරගෙන මේ වනවිට ලංකාවේ දේශපාලනය තරමක් කැළඹී ගිය උණුසුම් වන ආකාරයක් දැකගැනීමට පුළුවන. ඒ අනුව මේ වනවිට ලංකා දේශපාලනයේ කතාබහට ලක්වන අංක එකේ දේශපාලන මාතෘකාව බවට පත්ව ඇත්තේ අගවිනිසුරුවරයා ඇතුළු උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස් සීමාව තවත් අවුරුදු දෙකකින් ඉහළ නැංවීමට ආණ්ඩුව ගෙන ඇති යෝජනාවයි.**

මෙම යෝජනාවට මේ වනවිට විපක්ෂයේ දේශපාලන පක්ෂ පමණක් නොව, ශ්‍රී ලංකා නීතිඥ සංගමය, මහජනතාව සහ මහාචාර්යවරුන් ඇතුළු උගතුන් පාර්ශ්ව විනිසුරු සංගම්, ආසියානු නීතිඥ සංගමය සිය විරෝධය ප්‍රසිද්ධියේ පළකිරීමට කටයුතු කොට ඇති ආකාරයක් දැකගැනීමට පුළුවන. එපමණක් නොව අප පසුගිය සතියේ විශේෂ අනාවරණයක් කරමින් කියා සිටියේ ජවිපෙ නීතිඥවරුන්ද මේ සම්බන්ධයෙන් වූ සිය විරෝධය ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කොට ඇති බවකි. ජවිපෙ නීතිඥවරුන් සිය විරෝධය ප්‍රසිද්ධියේ පළකිරීමට කටයුතු නොකළ නමුත්, පෞද්ගලිකවම ජනාධිපතිවරයා හමුවී ඒ සම්බන්ධයෙන් සිය විරෝධය පළකිරීමට කටයුතු කළ ආකාරය ඉකුත් සතියේ 'රාජ්‍ය රහස්' තීරයේ වාර්තා කිරීමට අපි පියවර ගත්තෙමු.

මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමය සිය විරෝධය නිල වශයෙන් ආණ්ඩුවට පළකිරීමත් සමඟ එකෙනෙ පාර්ලිමේන්තුව ඇතුළත් සහ පාර්ලිමේන්තුවෙන් පිටත ආණ්ඩුවේ මෙම උත්සාහයට විරෝධය පළකරමින් කටයුතු කළ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාද තවත් පියවරක් ඉදිරියට තැබීමට පියවර ගත්තේය. මීට සති කිහිපයකට අහතදී ශ්‍රී ලංකා නීතිඥ සංගමයට ලිපියක් යැවූ විපක්ෂ නායකවරයා ආණ්ඩුවේ මෙම උත්සාහයට විරුද්ධව කටයුතු කරන සියලු පාර්ශ්වයන් ඒකරාශී කරගෙන විශේෂ සංවාදයක් පැවැත්වීමට කටයුතු කරන ලෙසත්, තමන් සහ සජබය එම සංවාදයට එක්වීමට සූදානම් බවත් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ප්‍රධානීන්ට දැනුම් දී සිටියේය. සජිත් විසින් කරනු ලැබූ මෙම ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින් ශ්‍රී ලංකා නීතිඥ සංගමය පසුගිය සෙනසුරාදා දිනයේ පදනම් ආයතනයේදී මේ සම්බන්ධයෙන් විශේෂ හමුවක් කැඳවීමට පියවර ගෙන තිබිණි. ඊට දේශපාලන නියෝජිතයන්ට පමණක් නොව, සිවිල් සංවිධාන නියෝජිතයන්ටද, නීතිඥවරුන්ටද, මේ සම්බන්ධයෙන් උනන්දුවෙන් පසුවන කණ්ඩායම්වලටද ආරාධනා කිරීමට නීතිඥ සංගමය කටයුතු කොට තිබිණි. ඒ අනුව, ඊට විශාල පිරිසක් එක්ව සිටි ආකාරයක්ද දැකගත හැකි විය.

> මෙම හමුවෙන් පසු මාධ්‍ය හමුවේ අදහස් දැක්වූ සජිත් ඇතුළු සියලු දෙනා ආණ්ඩුවේ මෙම උත්සාහයට විරෝධය පළකරමින් එය පරාජයට පත්කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගන්නා බව ප්‍රකාශ කළ ආකාරයක් දැකගත හැකි විය. මෙහිදී දේශපාලන පක්ෂ නායකයකු ලෙස සහ විපක්ෂ නායකවරයා ලෙස සජිත් මුල සිටම ආණ්ඩුවේ මෙම උත්සාහයට එරෙහිව මහජන මතයක් නිර්මාණය කිරීමට කටයුතු කළේ ක්‍රමානුකූලව පියවරෙන් පියවරය. මුලින්ම සජිත් ආණ්ඩුවේ මෙම උත්සාහය පිළිබඳ පාර්ලිමේන්තුව තුළත් ඉන් පිටතදීත් අදහස් දක්වමින් ඒ සම්බන්ධයෙන් ජනතාව අතර මතයක් ඇතිකිරීමට පියවර ගත්තේය.

මෙහිදී විවිධ පාර්ශ්වවලින් විවිධ අදහස් මේ සම්බන්ධයෙන් මතුවූ නමුත්, පොදුවේ ගත්කල අගවිනිසුරුගේ සහ උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස් සීමාව දීර්ඝ කිරීම මේ අවස්ථාවේ නොකළ යුතු එකක් බව අතිබහුතරයකගේ අදහස වී තිබිණි. නමුත් ඊට පක්ෂවද මෙහිදී යම් යම් අදහස් සහ මතිමතාන්තර පළ නොවූවා නොවේ. නමුත් එහිදීද කාලය දීර්ඝ කිරීමේ උත්සාහයට වඩා එය දේශපාලනයට ඈඳා ගැනීම සම්බන්ධයෙන් යම් විරෝධයක් සියලු දෙනාගේම අදහස්වල තිබූ ආකාරයක් දැකගත හැකි විය.

මෙම හමුවෙන් පසු මාධ්‍ය හමුවේ අදහස් දැක්වූ සජිත් ඇතුළු සියලු දෙනා ආණ්ඩුවේ මෙම උත්සාහයට විරෝධය පළකරමින් එය පරාජයට පත්කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගන්නා බව ප්‍රකාශ කළ ආකාරයක් දැකගත හැකි විය. මෙහිදී දේශපාලන පක්ෂ නායකයකු ලෙස සහ විපක්ෂ නායකවරයා ලෙස සජිත් මුල සිටම ආණ්ඩුවේ මෙම උත්සාහයට එරෙහිව මහජන මතයක් නිර්මාණය කිරීමට කටයුතු කළේ ක්‍රමානුකූලව පියවරෙන් පියවරය. මුලින්ම සජිත් ආණ්ඩුවේ මෙම උත්සාහය පිළිබඳ පාර්ලිමේන්තුව තුළත් ඉන් පිටතදීත් අදහස් දක්වමින් ඒ සම්බන්ධයෙන් ජනතාව අතර මතයක් ඇතිකිරීමට පියවර ගත්තේය. ඉන් අනතුරුව සජිත් පාර්ලිමේන්තුවේ විපක්ෂය නියෝජනය කරන සියලු පක්ෂ සමඟ ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට පියවර ගත්තේය. ඊට එරෙහිව ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සාකච්ඡා කළේය. ඉන් අනතුරුව විපක්ෂ නායකවරයා සිවිල් සංවිධාන නියෝජිතයන් සමඟද මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට පියවර ගත්තේය. සජිත් ශ්‍රී ලංකා නීතිඥ සංගමය සමඟ ප්‍රසිද්ධ හමුවකට එක්වූයේ මේ ආකාරයට ඊට අවශ්‍ය පෙළගැස්ම පියවරෙන් පියවර සකස් කිරීමෙන් අනතුරුවය. එපමණක් නොව සිකුරාදා දිනයේදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා කල්තැබීමේ විවාදයක් පාර්ලිමේන්තුවේදී ඉල්ලා

## 18 තීරණාත්මකයි

කතානායකවරයා වෙත විශේෂ ලිපියක් භාරදීමටද සජිත් ඇතුළු සජබය කටයුතු කළේය.

**ඒ අනුව, සජිත් ක්‍රමානුකූලව ඉදිරියට රැගෙන ආ මෙම සංවාදය මේ මස 18 වැනිදා අතිශය තීරණාත්මක තැනකට පත්වීමට නියමිතය. ඒ, ශ්‍රී ලංකා අධිකරණ සේවා සංගමයේ මහසභා රැස්වීම පැවැත්වීම එදිනට නියම කොට තිබීම හේතුකොට ගෙනය. ශ්‍රී ලංකා අධිකරණ සේවා සංගමය යනු ප්‍රබල ආයතනයක් වන අතර, එය අධිකරණ නිලධාරීන්, දිසා විනිසුරුවරුන්, මහෙස්ත්‍රාත්වරුන් ඇතුළු අධිකරණවල විනිසුරුවරුන්ගෙන් සමන්විත අතිශය ප්‍රබල ආයතනයකි.**

ඒ අනුව, අගවිනිසුරු ඇතුළු උපරිමාධිකරණ

> ඒ අනුව, එහි මහා සභා රැස්වීමේදී ආණ්ඩුවේ මෙම උත්සාහය සම්බන්ධයෙන් කුමන මතයක් ප්‍රකාශ වනු ඇද්ද, ඊට පක්ෂව අදහස් පළවනු ඇද්ද, ඊට විරුද්ධව අදහස් පළවනු ඇද්ද, යම් යෝජනාවක් එහිදී සම්මත වනු ඇද්ද යන්න සම්බන්ධයෙන් බොහෝ දෙනා තුළ පවතින්නේ විශාල උනන්දුවකි. කෙසේ වෙතත් කිසිදු ප්‍රසිද්ධියක් නොමැති යම් යම් නිර්නාමික සමාජ මාධ්‍ය පිටු ඔස්සේ මෙය කඩාකප්පල් කිරීම සඳහා විවිධ කණ්ඩායම් විසින් මෙහෙයුම් දියත් කරමින් ඇති ආකාරයක් දැකගන්නට ඇති අතර, එහිදී ඇතැමුන්ගේ නම්ගම් පවා සඳහන් කරමින් ඒවායේ යම් යම් අදහස් පළකර ඇති ආකාරයක් මේ වනවිට දැකගැනීමට පුළුවන.

විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීම සම්බන්ධයෙන් එළිපෙහෙළි දැවැන්ත සාකච්ඡාවක් පැවැත්වෙන මොහොතක විනිසුරුවරුන්ගේ නියෝජිතත්වය ඇති ශ්‍රී ලංකා අධිකරණ සේවා සංගමය මෙම රැස්වීම දෙස නීති ක්ෂේත්‍රයේ සියලු පාර්ශ්වයන්ගේ දැඩි අවධානය යොමුව ඇති බවක් දැකගැනීමට පුළුවන. ඒ අනුව, එහි මහා සභා රැස්වීමේදී ආණ්ඩුවේ මෙම උත්සාහය සම්බන්ධයෙන් කුමන මතයක් ප්‍රකාශ වනු ඇද්ද, ඊට පක්ෂව අදහස් පළවනු ඇද්ද, ඊට විරුද්ධව අදහස් පළවනු ඇද්ද, යම් යෝජනාවක් එහිදී සම්මත වනු ඇද්ද යන්න සම්බන්ධයෙන් බොහෝ දෙනා තුළ පවතින්නේ විශාල උනන්දුවකි. කෙසේ වෙතත් කිසිදු ප්‍රසිද්ධියක් නොමැති යම් යම් නිර්නාමික සමාජ මාධ්‍ය පිටු ඔස්සේ මෙය කඩාකප්පල් කිරීම සඳහා විවිධ කණ්ඩායම් විසින් මෙහෙයුම් දියත් කරමින් ඇති ආකාරයක් දැකගන්නට ඇති අතර, එහිදී ඇතැමුන්ගේ නම්ගම් පවා සඳහන් කරමින් ඒවායේ යම් යම් අදහස් පළකර ඇති ආකාරයක් මේ වනවිට දැකගැනීමට පුළුවන. ඒ අනුව ලබන 18 දා පැවැත්වෙන මෙම රැස්වීම අතිශය තීරණාත්මක රැස්වීමක් වනු ඇති බවක් මෙහිදී සඳහන් කළ යුතුව ඇත.

## සජිත්ට පහර දෙන හැටි

**මේ අතර අප පසුගිය කාලසීමාව පුරා 'රාජ්‍ය රහස්' තීරය ඔස්සේ ජන්දයක් ජයග්‍රහණය කිරීමට නොහැකි, විවිධ පක්ෂ සහ පුද්ගලයන්, අවුරුදු 30 ඉක්මවා තිබියදීත් තවදුරටත් දේශපාලනයේ හොඳ සිටින පරාජිත සහ සත්‍ය දේශපාලන නායකයන්, ජනතාව ප්‍රතික්ෂේප කළ යම් යම් කොටස් සහ කණ්ඩායම් තිබියදී කලබලකාරී පත්ව විවිධ දේශපාලන හමු, මාධ්‍ය සාකච්ඡා, සම්මන්ත්‍රණ පැවැත්වීමට කටයුතු කරමින් සිටින ආකාරයක් වාර්තා කළෙමු.**

මෙහිදී මෙසේ කලබලයට පත්ව විවිධ අගුපිල්වල දේශපාලන සාකච්ඡා, සම්මන්ත්‍රණ, මාධ්‍ය හමු පවත්වන්නේ පසුගිය කාලසීමාවේ විවිධ තනතුරු දැරූ සහ විවිධ අක්‍රමිකතා, දූෂණ, අල්ලස් ගැනීම් සහ දේශපාලන බලය අවභාවිත කිරීම සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇති සහ විමර්ශන පැවැත්වෙන පුද්ගලයන් සහ කල්ලි කණ්ඩායම් බවද අප එහිදී අනාවරණය කළෙමු. ඔවුන් එම සාකච්ඡා, සම්මන්ත්‍රණ සඳහා විවිධ මලපැණි එල්ල කරමින් විපක්ෂ නායක සජිත්වත්, සමඟි ජන බලවේගයත් ඊට එක්කර ගැනීම සඳහා විවිධ උපක්‍රම යොදමින් සිටින ආකාරය පිළිබඳවත් අප මෙම තීරයෙන් පෙන්වා දුන්නෙමු. කෙසේ වෙතත් කුමන බලපෑම් පැමිණියද දූෂිත ගනුදෙනුවලට සම්බන්ධ සහ දූෂණ චෝදනා එල්ල වී ඇති පුද්ගලයන් සම්බන්ධයෙන් කිසිසේත්ම පෙනී නොසිටින බව සජිත් අවස්ථා කිහිපයකදීම සජබයටත්, එහි ජ්‍යෝෂ්ඨයන්ටත් දැනුම් දී තිබූ බවද අප මෙම තීරයෙන් අනාවරණය කළෙමු. එය සජබ ප්‍රතිපත්තිය බව එහිදී සජිත් අවධාරණය කළ බවක්ද අපි පෙන්වා දුන්නෙමු.

කෙසේ වෙතත් විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීමේ ආණ්ඩුවේ වැඩපිළිවෙළේදී සජිත් ඊට එරෙහිව ක්‍රමානුකූලව පියවරෙන් පියවර ඉදිරියට යද්දී දූෂණ චෝදනා එල්ල වී ඇති විවිධ පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට සජිත් සහ සජබය පාරට ගැනීමේ අවකාශය මඟුව තිබූ ආකාරයක් පසුගිය කාලයේදී දැකගන්නට ලැබිණි. ඊට හේතුවී තිබුණේ එසේ සජිත් සහ සජබය ආණ්ඩුවට එරෙහිව පාරට ගෙන තමන්ට එල්ල වී ඇති දූෂණ චෝදනා සහ විමර්ශන කෙසේ හෝ යටපත් කරගැනීමට ඔවුන් දැරූ උත්සාහයය. ඒ අනුව සජිත්ව මෙසේ ආණ්ඩුවට එරෙහිව පාරට ගැනීම සඳහා රනිල්ගේ පාර්ශ්වයෙනුත්, විවිධ කල්ලි කණ්ඩායම්වලිනුත් සජිත් ඉලක්ක කොටගෙන දැවැන්ත මාධ්‍ය මෙහෙයුමක් දියත් කළ ආකාරයක් පසුගිය සතිය වනවිට දැකගන්නට ලැබිණි. ඒ අනුව, සමාජ මාධ්‍ය ඔස්සේ මේ කණ්ඩායම්වල අනුග්‍රහයෙන් 'සජිත් ආණ්ඩුවත් එක්ක ඩීල් එකක', 'සජිත් විපක්ෂයේ කාර්යභාරය හරියට කරන්නේ නෑ', 'සජිත්ට පණ නෑ' ආදී ව ශයෙන් කියමින් මාධ්‍ය මෙහෙයුමක් දියත් කර තිබූ ආකාරයක් දැකගත හැකි විය. මේ වනවිට සජබ ප්‍රධානීන්ට මතුව ඇති සැකයක් වී ඇත්තේ සජබය ඇතුළේ සිටින රනිල් හිතවාදී සුළු කණ්ඩායමක්ද එම මාධ්‍ය මෙහෙයුමට රනිල්වාදීන් විසින් එක්කොට ගෙන ඇති බවය. විශේෂයෙන්ම රනිල් ජනාධිපතිවරයා වශයෙන් කටයුතු කළ කාලසීමාවේදී රනිල් සමඟ ඩීල් දමමින් බාර් ලයිසන් ලබාගත්, විවිධ කොන්ත්‍රාත් ලබාගත්, මන්ත්‍රී ප්‍රතිපාදන ලබාගත්, මන්පැන් නිෂ්පාදනය කිරීමේ බලපත්‍ර ලබාගත් සජබ මන්ත්‍රීවරුන් හත්අට දෙනකු තවමත් සජබයේ නැතුවාම නොවේ. ඔවුන්ගෙන්ද කිහිප දෙනකු සජිත්ට සහ සජබයට ප්‍රහාර එල්ල කිරීම සඳහා යොදාගැනීමේ උත්සාහයක් පවතින බවට තොරතුරු වාර්තා වීමත් සමඟ සජිත් පක්ෂයේ ජ්‍යෝෂ්ඨයන් සමඟ පසුගිය සතියේදී මේ සම්බන්ධයෙන් දීර්ඝ සාකච්ඡාවක් සිදුකිරීමට පියවර ගත්තේය. එහිදී සජිත් මේ සියලු දෙනාටම මෙම ප්‍රහාරය එල්ල වන්නේ කොහෙන්ද, එය මෙහෙයවන්නේ කවුද, ඊට සහාය දෙන්නේ කවුද, ඒ සඳහා අවශ්‍ය මුදල් පොම්ප කරන්නේ කවුද යනාදිය සම්බන්ධයෙන් සියලු තොරතුරු හෙළිදරව් කිරීමට සජිත් පියවර ගත්තේය. එමෙන්ම අපට ඇති තොරතුරුවලින්ද කියැවෙන්නේ හොඳනැගෙමින් පවතින සජබ - එජාප එකමුතුව කඩාකප්පල් කිරීම සඳහා රනිල් හා රනිල් වටා සිටින භූතයන් දෙතුන් දෙනකු සජිත්ට එරෙහි මෙම මාධ්‍ය මෙහෙයුම් පසුපස සිටින බවකි.

## උපන් ගෙයි ලෙඩක්

PAGE - 08



# සජිත්ට අතට අත දී අනුර යන්න යයි

රාජ්‍ය රහස්

කපිල පුංචිමාන්නගේ

**කෙසේ වෙතත් පසුගිය කාලසීමාවේදී එළිපිටම රනිල්ද මෙම මෙහෙයුමට සම්බන්ධ වී සිටි නමුත්, මේ වනවිට රනිල් එළියට එන්නේ නැතිව වෙනත් ක්‍රමවලින් සජිත්ට සහ සජබයට පහරදීමට කටයුතු කරමින් සිටින ආකාරයක් දැකගන්නට පුළුවන.**

සාමාන්‍යයෙන් මෙය සැලකෙන්නේ උත්පත්තියේ සිට රනිල්ගේ ඇඟේ ඇති දේශපාලන ලෙඩක් ලෙසටය. මුදල් අවභාවිත කිරීමේ චෝදනාව මත රනිල් අත්අඩංගුවට පත්වූ පසු ඇප ලබාගැනීම සඳහා රනිල්ට ඇති ලෙඩ රෝග ගණනාවක් පිළිබඳව අධිකරණයේදී තොරතුරු හෙළිදරව් කෙරුණු නමුත් රනිල්ගේ දේශපාලන උත්පත්තියේ සිටම පැවැත එන 'නිවුස් ප්ලාන්ට් කිරීමේ රෝගය' පිළිබඳ 'රාජ්‍ය රහස්' තීරය විසින් රටට අනාවරණ කරන තෙක්ම වෙනත් කිසිදු ආකාරයකින් තොරතුරු එළියට ආවේ නැත. පසුගිය කාලය පුරාම රනිල් සහ රනිල්ට හිතවත් මාධ්‍යවේදීන් කිහිප දෙනකු සජබය ඇතුළේ ප්‍රශ්න ඇතිකිරීම සඳහාත්, සජිත්ව දේශපාලන වශයෙන් විනාශ කිරීම සඳහාත් තම පවුලට අයත් මාධ්‍ය ඔස්සේත් වෙනත් මාධ්‍ය ඔස්සේත් බොරු නිවුස් ප්ලාන්ට් කිරීමේ මෙහෙයුමක් දියත් කොට තිබිණි. විශේෂයෙන්ම රනිල් අත්අඩංගුවට පත්වූ අවස්ථාවේදී පරණ දේශපාලන තරහමරහා අමතක කළ සජිත්, අවංකවම රනිල් බේරාග ැනීම සඳහා ඉදිරියට පැමිණියේය. දිනපතාම පාහේ රනිල්ගේ සුවදුක් විමසීම සඳහා වැලිකඩ බන්ධනාග ාරයටත්, කොළඹ ජාතික රෝහලටත් ගියේය. අවසානයේදී රනිල් වෙනුවෙන් සජබයද පාරට අරන් ආවේය. නමුත් ඊට රනිල් ප්‍රතිචාර දැක්වූයේ ජාතික රෝහලේ ප්‍රතිකාර ගනිමින් සිටියදීම සජිත්ව අත්අඩංගුවට ගැනීමට නියමිත බව සඳහන් කරමින් තමන්ගේ පවුලේ මාධ්‍යවල සජිත්ට එරෙහිව බොරු පුවත් පළ කිරීම හරහාය. නමුත් අප ඒ සම්බන්ධයෙන් සියලු තොරතුරු රටට අනාවරණ කිරීම හේතුකොට ගෙන රනිල්ගේ එම මාධ්‍ය මෙහෙයුම ආපසු හැරකී ගියේය.

ඉන් අනතුරුව ඒ සියල්ලද අමතක කොට පක්ෂ දෙක එකමුතු කිරීම වෙනුවෙන් නැවත වතාවක් රනිල් සමග මුහුණට මුහුණ සාකච්ඡාවක් පැවැත්වීමට සජිත් තීරණය කළේය. ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා පක්ෂ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාර, පක්ෂ සභාපති කබීර් හෂීම් යන මන්ත්‍රීවරුන් රනිල්ගේ පෞද්ගලික නිවසට යැවීමටද සජිත් පියවර ගත්තේය. එපමණක් නොව අවසානයේදී තමන්ද කොල්ලුපිටියේ පස්වැනි පටුමගේ පිහිටි රනිල්ගේ නිවසට ගොස් ඔහු සමග සාකච්ඡා කිරීමට සජිත් කටයුතු කළේය. එසේ තිබියදීත් සුපුරුදු පරිදි සජිත් ඉලක්ක කොටගෙන නැවත වතාවක් මාධ්‍ය හරහා ප්‍රහාර මාලාවක් එල්ල කිරීමට රනිල්ගේ පාර්ශ්වය සහ එජාපයට අරක් ගෙන සිටින භූතයන් කටයුතු කරමින් සිටින ආකාරයක් දැකගන්නට පුළුවන. ඒ අනුව සජබ ප්‍රධානීන් සමග පැවැති සාකච්ඡාවේදී සජිත් තමන්ට එල්ල කරන මෙම ප්‍රහාර පිළිබඳවත්, ඒවාට සම්බන්ධ පිරිස් පිළිබඳවත්, සජබයෙන්ද ඊට උල්පන්දම් දෙන මන්ත්‍රීවරුන් කිහිප දෙනකු පිළිබඳවත් හෙළිදරව් කිරීමට පියවර ගෙන තිබිණි. ඒ කෙසේ වෙතත් සජිත් එහිදී ඉතා දැඩි ප්‍රකාශයක් සිදුකිරීමටද පියවර ගත්තේය. ඒ තමන් හෝ සජබය කිසිදු අවස්ථාවක දූෂිතයන් වෙනුවෙන් පෙනී නොසිටින බව ප්‍රකාශ කරමින්ය.

'මම දන්නවා මට මේ විදියට ගහන්නේ කවුද කියලා. ඒවා කරන අයයි, ඒවා කරන විදියයි ගැන මම හොඳට දන්නවා. අපේම සමහර මන්ත්‍රීවරුත් ඒවට සම්බන්ධ වෙලා ඉන්න විදිය ගැනත් මම දන්නවා. හැබැයි මට ඔහොම නෙවෙයි කොහොම ගැහුවත් කිසිම දවසක මම මේ දූෂිතයන් වෙනුවෙන්වත්, දූෂණ චෝදනා එල්ල වෙලා තියෙන අය වෙනුවෙන්වත්, දූෂිත ගනුදෙනු කරපු අය වෙනුවෙන්වත් පෙනී ඉන්නේ නෑ. ඒ වගේම කිසිම වෙලාවක සජබයවත් ඔය දූෂිතයන් වෙනුවෙන් පෙනී ඉන්න තැනට මම පත් කරන්නේ නෑ...' යනුවෙන් සජිත් එහිදී ඍජු ප්‍රකාශයක් කිරීමට කටයුතු කළ ආකාරයක් දැකගත හැකි විය.

ඉන් අනතුරුව පිරිස අතර සාකච්ඡාවට ලක්වූයේ අල්ලස් චෝදනාවකට අත්අඩංගුවට ගෙන ඇති චරිත් අබේසිංහ සම්බන්ධයෙනි. එහිදී ඇතැමුන් කියා සිටියේ නිර්නාමික චෝදනාවක් එල්ල වූ පමණින් චරිත් අබේසිංහව පක්ෂයෙන් ඉවත් කිරීම වැරැදි යැයි කියාය. ඊට සජිත් දුන්නේ මෙවැනි පිළිතුරකි.

'අපි චරිත්ව අයින් කරලා නැහැ. චරිත්ට චෝදනාවක් එල්ල වෙලා තියෙන නිසා එයා ගැන පක්ෂයෙන් විමර්ශනයක් කරමින් ඉන්නේ. චරිත් ඒකෙන් නිදහස් වුණොත් අපිට එයාව ආයෙම දේශපාලනයට ගේන්න පුළුවන්. ඒ නිසා චරිත් වෙනුවෙන් පක්ෂයෙන් කරන දේවල් ඔබතුමාලා ඒ විදියටම කරගෙන යන්න...' යන්න සජිත් එහිදී දී තිබූ පිළිතුර විය.

කෙසේ වෙතත් මේ වනවිටත් බන්ධනාගාරගතව සිටින චරිත්ගේ දුක සැප විමසීම සඳහා සජබ මන්ත්‍රීවරුන් කිහිප දෙනකු වැලිකඩ බන්ධනාගාරයට ගොස් තිබිණි. එමෙන්ම පසුගිය සතියේ සජබ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාරද වැලිකඩ බන්ධනාගාරයට ගොස් චරිත්ව හමුවීමට පියවර ගත්තේය. රංජිත් එසේ ගොස් තිබුණේ නිකන්ම නොව, සජිත්ගේ පණිවුඩයක්ද රැගෙනය. ඒ අනුව චරිත් වෙනුවෙන් පක්ෂය ගනු ලැබූ තීන්දුව පිළිබඳ චරිත්ව දැනුවත් කළ රංජිත් මද්දුමබණ්ඩාර එම තීන්දුව ගැනීමට බලපෑ හේතු මෙන්ම එළියේ පවතින දේශපාලන තත්ත්වය පිළිබඳවද චරිත්ව දැනුවත් කිරීමට පියවර ගෙන තිබිණි.

## අනුර කතා නොකරම යයි

**පසුගිය බ්‍රහස්පතින්දා දිනයේදී මහාවිහාරවංශික ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උපසම්පදා මහෝත්සවය රාජ්‍ය අනුග්‍රහයෙන් මහත් උත්සවශ්‍රීයෙන් යුතුව පැවැත්වීමට පියවර ගෙන තිබිණි. පවතින දේශපාලන අර්බුද සහ මතගැටුම් මැද්දේ මෙම උපසම්පදා උත්සවයට සියලු දෙනාගේම ඇස් යොමුවී තිබුණේ ජනාධිපතිවරයාත්, විපක්ෂ නායකවරයාත් මුහුණට මුහුණ හමුවන අවස්ථාවක් ලෙස මෙම උත්සවය දැකග න්නට ලැබීම නිසාය.**

ඒ අනුව නියමිත වේලාවට ජනාධිපතිවරයාත්, විපක්ෂ නායකවරයාත් උත්සවයට සහභාගි වූ අතර, ඔවුන්ට අමතරව සංස්කෘතික අමාත්‍ය සුනිල් සෙනෙවි මහතාත්, අමරපුර මහා නිකායේ නායක ස්වාමින්වහන්සේලා ප්‍රමුඛ විශාල පිරිසකුත් ඊට සහභාගි වී සිටි ආකාරයක් දැකගන්නට ලැබිණි.

කෙසේ වෙතත් උත්සව සභාවේ කාලසටහන සකස් වී තිබුණේ මුලින්ම අමරපුර නිකායේ නායක ස්වාමින්වහන්සේලාගේ කතාවලින් අනතුරුව සංස්කෘතික අමාත්‍යවරයාගේ කතාවත්, ඉන් අනතුරුව විපක්ෂ නායකවරයාගේ සහ ජනාධිපතිවරයාගේ කතාවත් ආදී වශයෙන් පෙළගස්වමිනි. නමුත් උත්සව සභාව ආරම්භ වී විනාඩි 40ක් පමණ ගිය පසු ජනාධිපතිවරයා හිටිහැටියේම කිසිවකුටත් කතා නොකර උත්සව සභාවෙන් පිටව යෑමට පියවර ගත් ආකාරයක් දැකගන්නට ලැබිණි. එහිදී ජනාධිපතිවරයා සිය ආසනයෙන් නැගිට කෙළින්ම විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා අසලට ගොස් ඔහුට අතට අත දී තමන් වෙනත් කටයුත්තකට යන බව කියමින් උත්සව සභාවෙන් පිටව යෑමට කටයුතු කර තිබිණි. නමුත් එම කටයුත්ත කුමක්ද යන්න පිළිබඳ හෝ වෙන යම් කාරණාවක් එහිදී ජනාධිපතිවරයා සජිත්ට දැනුම් දීමට කටයුතු කර තිබුණේ නැත.

කෙසේ වෙතත් මේ ආකාරයට සිය කතාවද නොකර රාජ්‍ය අනුග්‍රහය ලබාදී තිබූ උපසම්පදා කටයුත්තක් අතරතුර ජනාධිපතිවරයා හිටිහැටියේම පිටව යෑම ඒ අවස්ථාවේදී බොහෝ දෙනා තුළ ප්‍රශ්නාර්ථයක් මතුකොට තිබූ එකක් බව රැස්ව සිටි අයගේ මුහුණු දෙස බැලූ විට පැහැදිලිවම දැකගන්නට ලැබිණි. ඒ අනුව, රැස්ව සිටි ස්වාමීන්වහන්සේලාත්, ප්‍රභූ පිරිසත් මේ සම්බන්ධයෙන් විවිධ කරුණු දැක්වීම් සිදුකළ ආකාරයක්ද දැකගන්නට ලැබිණි. එහිදී ඇතැමුන් කියා සිටියේ පූජ්‍ය ආචාර්ය මාදම්පාගම අස්සජි හිමියන් සිදුකළ කතාවෙන් පසු ජනාධිපතිවරයා මෙසේ උත්සව සභාවෙන් පිටව ගිය බවකි. සිය කතාවේදී මාදම්පාගම අස්සජි හිමියන් රාජ්‍ය නායකයාගේ ගුණ වර්ණනා කරන අතරවාරයේම වත්මන් පාලන සමයේදී විවිධ රාජ්‍ය නොවන කල්ලි, සංවිධාන මගින් බුද්ධ ශාසනයට එල්ල වී ඇති තර්ජන පිළිබඳ සඳහන් කිරීම හේතුවෙන් ජනාධිපතිවරයා යම් සිත් තැවුලකට පත්ව මෙසේ උත්සව සභාවෙන් පිටව ගිය බව ඇතැමුන් සඳහන් කරන ආකාරයක්ද පෙනෙන්නට තිබිණි. ඒ කෙසේ වෙතත් බොහෝ දෙනා එහිදී කියා සිටියේ එවැනි රාජ්‍ය අනුග්‍රහයක් ලබාදුන් ප්‍රධාන උත්සවයකදී සිය කතාව හෝ සිදු නොකොට ජනාධිපතිවරයා අතරමගදී නැගිට පිටව යෑම සුදුසු එකක් නොවන බවකි. කෙසේ වෙතත් ජනාධිපතිවරයා එසේ උත්සව සභාවෙන් පිටව ගියද විපක්ෂ නායකවරයා සිය කතාව අතරතුරදී බුද්ධ ශාසනයට එල්ල වී ඇති අභියෝග සහ කුමන්ත්‍රණ පිළිබඳ කළ අදහස් දැක්වීම සියලු හිමිවරුන්ගේ ප්‍රසාදයට ලක්වූ ආකාරයක් දැකගත හැකි විය.

## නිවාස අඩස්සිය

**නිලධාරීන් සහ රැඳවියන් 28 දෙනකුගේ ජීවිත අහිමි කරමින් අවසන් වූ මීගමුව බන්ධනාගාරයේ ගැටුම සම්බන්ධයෙන් මේ වනවිට විවිධ තොරතුරු සමාජ මාධ්‍ය ඔස්සේත්, නිල මාධ්‍ය ඔස්සේත් ශ්‍රවණාරූ වන ආකාරයක් දැකගන්නට පුළුවන. ඒ සම්බන්ධයෙන් ඉදිරි විමර්ශනවලදී ආන්දෝලනාත්මක හෙළිදරව් විම රැසක් සිදුවීමට නියමිතව ඇති බවක් අපටද ලැබෙන තොරතුරුවලින් දැනගන්නට තිබේ.**

ඒ කෙසේ වෙතත් දැනට ඇති තොරතුරුවලින් කියැවෙන්නේ මෙම ගැටුමට බන්ධනාගාරවල ඇති තදබදයද ප්‍රධාන හේතුවක් වී ඇති බවය. මීගමුව බන්ධනාගාරයේ 600ක් රඳවා තැබීමේ පහසුකම් ඇති නමුත්, ගැටුම සිදුවන විට එහි 2,400ක පිරිසක් රඳවා තිබීම හේතුවෙන් සිරකරුවන් අතර තිබූ පීඩනයද ගැටුමට එක් හේතුවක් ලෙස දැක්විය හැකිය.

කෙසේ වෙතත් පසුගිය සතියේ ගැටුම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ පැවැති උණුසුම් විවාදයේදී අධිකරණ අමාත්‍ය හර්ෂණ නානායක්කාර මහතාගේ කටින් මීට අදාළ විශේෂ කාරණාවක් එළියට පැන්නේය. එහිදී හර්ෂණ කියා සිටියේ මෙම බන්ධනාගාර තදබදයට පිළියමක් වශයෙන් සුළු වැරැදි සම්බන්ධයෙන් බන්ධනාග ාරගත කරන සිරකරුවන් නිවාස අඩස්සියේ තැබීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කරමින් සිටින බවය.

'රිමාන්ඩ් යන එක වැඩියි. අන්න ඒ හින්දා අපි මේ දවස්වල පත්කරලා තියනවා කමිටුවක් නිවාස අඩස්සි පනත ගැන කතාකරන්න. එහෙම නැත්තන් හිරේ යවනවා වෙනුවට ඔවුන්ව ගෙදර නිවාස අඩස්සියේ තබලා විද්‍යුත් අධීක්ෂණ ක්‍රමයක් සකස් කරන්න. මං මේ කරුණු කීපයක් පමණයි කිව්වේ. ඒක නිසා අපි උඩ බලාගෙන හිටියා නෙමෙයි...' යනුවෙන් එහිදී හර්ෂණ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කොට තිබිණි.

නමුත් හර්ෂණ මේ කතාව කියද්දීම ඊට ප්‍රතිචාර දැක්වූ හිටපු අධිකරණ නියෝජ්‍ය අමාත්‍යවරයකු වන අනුරාධ ජයරත්න කියා සිටියේ මේ සම්බන්ධයෙන් හිටපු රජය කෙටුම්පත් පවා සකස් කොට එසේ නිවාස අඩස්සියේ තබන රැඳවියන්ට දැමීම සඳහා අවශ්‍ය වළලු (බැන්ගල්) පවා ගෙනැවිත් ඇති බවය.

ඒ අනුව අපද මේ නිවාස අඩස්සි කතාවේ ඉතිහාසය සොයාබැලීමට පියවර ගත්තෙමු. ඒ අනුව අපට දැනග න්නට ලැබුණේ රනිල්ගේ ආණ්ඩු සමයේදී හිටපු අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතා විසින් 2023 වසරේ දෙසැම්බර් මාසයේදී ඊට අදාළ කැබිනට් පත්‍රිකාවක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කොට කැබිනට් අනුමැතිය ලබාගැනීමට කටයුතු කොට ඇති බවකි. ඒ අනුව ඊට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සකස් කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගෙන් සමන්විත කමිටුවක්ද පත්කිරීමට විජයදාස කටයුතු කොට තිබිණි. ඒ අනුව ඊට අදාළ කමිටු වාර්තාව නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකිරීමටද එවක ආණ්ඩුව කටයුතු කොට තිබිණි. නමුත් මැතිවරණ උණුසුම සහ ජනාධිපතිවරණ පරාජයත් සමග එම කෙටුම්පත ඉන් ඉදිරියට ගියේ නැත.

ඒ අනුව, හර්ෂණ පාර්ලිමේන්තුවේදී අනාවරණ කළ මෙම නිවාස අඩස්සි පනත් කතාව මෙම කෙටුම්පතේ දිගුවක්ද කියන්න තවම තොරතුරු නැත. නමුත් හර්ෂණ කියා සිටියේ ඒ සම්බන්ධයෙන් අදාළ පියවර ගැනීම සඳහා මේ වනවිට කමිටුවක් පත්කොට ඇති බවය.

> දැනටමත් නිවාස අඩස්සි ක්‍රමය ක්‍රියාත්මක කරන බලවත් රටවල් කිහිපයක්ද තිබේ. ඉන් එක් රටක් වන්නේ ඇමෙරිකාවය. මීට අමතරව බ්‍රිතාන්‍යය, කැනඩාව, ඔස්ට්‍රේලියාවේ ඇතැම් ප්‍රාන්ත, නවසීලන්තය, ප්‍රංශය, ස්පාඤ්ඤය, බෙල්ජියම, නෙදර්ලන්තය, සිංගප්පූරුව, බ්‍රසීලය ආදී රටවල්ද මේ වනවිටත් නීතියක් ලෙස නිවාස අඩස්සියේ තැබීමේ ක්‍රමය ක්‍රියාත්මක කරමින් තිබේ.

කෙසේ වෙතත් මෑත කාලයේ ජාත්‍යන්තරයෙන් එවැනි ආකාරයේ දේශපාලන නායකයන් නිවාස අඩස්සියේ තැබීම පිළිබඳ උදාහරණ ඕනෑ තරම් තිබේ. තායිලන්තයේ හිටපු අගමැති තක්ෂින් ෂිනවාත්‍රා නිවාස අඩස්සියේ සිටියේය. එමෙන්ම මියැන්මාරයේ හිටපු නායිකා අවුන්සාන් සුකී මේ වනවිටද සිටින්නේ නිවාස අඩස්සියට පත්කොටය. මීට අමතරව ප්‍රංශයේ හිටපු ජනාධිපති අපේක්ෂිකාවක වන මැරින් ඩි පෙන් මහත්මියද මේ වනවිට සිටින්නේ දූෂණ චෝදනාවලට වරදකාරිය වී නිවාස අඩස්සියට පත්කොටය.

එමෙන්ම දැනටමත් නිවාස අඩස්සි ක්‍රමය ක්‍රියාත්මක කරන බලවත් රටවල් කිහිපයක්ද තිබේ. ඉන් එක් රටක් වන්නේ ඇමෙරිකාවය. මීට අමතරව බ්‍රිතාන්‍යය, කැනඩාව, ඔස්ට්‍රේලියාවේ ඇතැම් ප්‍රාන්ත, නවසීලන්තය, ප්‍රංශය, ස්පාඤ්ඤය, බෙල්ජියම, නෙදර්ලන්තය, සිංග ප්පූරුව, බ්‍රසීලය ආදී රටවල්ද මේ වනවිටත් නීතියක් ලෙස නිවාස අඩස්සියේ තැබීමේ ක්‍රමය ක්‍රියාත්මක කරමින් තිබේ. ඉන්දියාවද නීතිගත කොට නොතිබුණද යම් යම් අධිකරණවලට පුද්ගලයන් නිවාස අඩස්සියේ තැබීමේ බලය පැවරී ඇති ආකාරයක් දැකගත හැකිය.

කෙසේ වෙතත් මෙ වනවිට මතුව ඇති ප්‍රශ්නය වන්නේ ලංකාවේ මේ නීතිය ගෙන එන්නේ කවුරුන් වෙනුවෙන්දැයි කියාය. මන්ද යත් මේ වනවිට හිටපු දේශපාලනඥයන් රැසකට එරෙහිව අධිකරණ කටයුතු ක්‍රියාත්මක කරමින් පවතින අතර, ඉන් කිහිප දෙනකුම දැනටමත් බන්ධනාගාරගත කිරීමට පියවර ගෙන ඇත. එමෙන්ම ඉදිරි කාලවකවානුවේදී තවත් බොහෝ දේශපාලනඥයන් ප්‍රමාණයක් බන්ධනාගාරගත කිරීමට නියමිතව ඇති බවක් සිදුවන සිදුවීම්වලින් පැහැදිලිවම දැකගන්නට තිබේ. ඒ අනුව මෙසේ සිරගත කිරීමට නියමිතව සිටින දේශපාලනඥයන් නිවාස අඩස්සියේ තැබීමට මෙවැනි නීතියක් ගෙනෙනවාද, එසේත් නැත්නම් බන්ධනාගාරගත වන අපරාධකරුවන් නිවාස අඩස්සියේ තැබීමට මෙවැනි නීතියක් ගෙනෙනවාද යන්න සම්බන්ධයෙන් දැනගැනීමට සියල්ලන්ටම තව ටික කාලයක් බලා සිටීමට සිදුවනු ඇත.

## නාමල් සජිත්ට ලියයි

**මේ සියල්ල අතරවාරයේ පසුගිය සතියේ පොහොට්ටුවේ ජාතික සංවිධායක නාමල් රාජපක්ෂ මහතා හදිසියේම විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා හට ලිපියක් එවීමට කටයුතු කොට තිබිණි. එම ලිපියේ සඳහන් වූයේ අගවිනිසුරු ඇතුළු උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස වසර 2කින් දීර්ඝ කිරීමට ආණ්ඩුව දරණ උත්සාහයට එරෙහිව ප්‍රබල මැදිහත් වීමක් කරන ලෙසට සජිත්ගෙන් කරනු ලැබ තිබූ ඉල්ලීමකි.**

> එමෙන්ම මෙහිදී ඒකාබද්ධව සටන් කළ යුතු බවට නාමල් දක්වා ඇති අදහස පිළිබඳවද පිරිස අතර දීර්ඝ වශයෙන් සාකච්ඡාවට ලක්විය. එහිදීද සජබ ජ්‍යෙෂ්ඨයන් දැඩිව කියා සිටියේ මතුවන යම් යම් ගැටලුකාරී තත්ත්වයන්වලදී ඒකාබද්ධව ආණ්ඩුවට විරෝධය පළකළද පොහොට්ටුව සමග පෙරමුණුවලට යෑමට හෝ සන්ධානගත වීමකට කිසිසේත්ම කටයුතු නොකළ යුතු බවකි. සජබ ප්‍රතිපත්තිය හමුවේ කිසිම අවස්ථාවක පොහොට්ටුව සමග එක දේශපාලන වේදිකාවක කටයුතු කළ නොහැකි බවද මෙහිදී සජබ ජ්‍යෙෂ්ඨයන්ගේ අදහස වී තිබිණි.

කෙසේ වෙතත් මෙම ලිපිය දුටු සැණින් සජබ බොහෝ දෙනාගේ ඔළුවට ඇවිත් තිබුණේ මෙය නාමල්ගේ වුවමනාවට ලියා තිබූ එකකටත් වඩා පාර්ලිමේන්තුවෙන් පිටත විපක්ෂය යැයි තමන් විසින් හඳුන්වා ගන්නා, නඩුහබ ඇති යම් යම් කල්ලි කණ්ඩායම්වල වුවමනාවකට අනුව නාමල් විසින් එවා තිබූ එකක් බවකි. ඒ අනුව ලිපිය ලැබුණු සැණින් සජිත් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් කැඳවා මෙම ලිපිය සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක් පැවැත්වීමට පියවර ගත්තේය. එහිදී ඔවුන් පෙන්වා දුන්නේ මේ වනවිටත් සජිත් පාර්ලිමේන්තුවේත්, ඉන් පිටතත් මේ පිළිබඳ අදහස් දක්වමින් ශ්‍රී ලංකා නීතිඥ සංගමය පවා හමුවී දැවැන්ත වැඩපිළිවෙළකට යෑමට සූදානම් වන මේ මොහොතේ නාමල් විසින් මෙවැනි ලිපියක් එවා තිබීම පිළිගත නොහැකි යැයි කියාය. ඒ අනුව එම ලිපියට ප්‍රතිචාර දැක්විය යුතු නැති බව සජබ ප්‍රධානීන්ගේ අදහස වී තිබිණි.

එමෙන්ම මෙහිදී ඒකාබද්ධව සටන් කළ යුතු බවට නාමල් දක්වා ඇති අදහස පිළිබඳවද පිරිස අතර දීර්ඝ වශයෙන් සාකච්ඡාවට ලක්විය. එහිදීද සජබ ජ්‍යෙෂ්ඨයන් දැඩිව කියා සිටියේ මතුවන යම් යම් ගැටලුකාරී තත්ත්වයන්වලදී ඒකාබද්ධව ආණ්ඩුවට විරෝධය පළකළද පොහොට්ටුව සමග පෙරමුණුවලට යෑමට හෝ සන්ධානගත වීමකට කිසිසේත්ම කටයුතු නොකළ යුතු බවකි. සජබ ප්‍රතිපත්තිය හමුවේ කිසිම අවස්ථාවක පොහොට්ටුව සමග එක දේශපාලන වේදිකාවක කටයුතු කළ නොහැකි බවද මෙහිදී සජබ ජ්‍යෙෂ්ඨයන්ගේ අදහස වී තිබිණි.

පහත දැක්වෙන්නේ උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීමට ආණ්ඩුව දරන උත්සාහය සම්බන්ධයෙන් කරුණු දක්වමින් නාමල් විසින් සජිත් වෙත එවා තිබූ ලිපියය.

ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා
ශ්‍රී ලංකා පර්ලිමේන්තුවේ විපක්ෂ නායක,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

ගරු විපක්ෂ නායකතුමනි,
2026.07.07

හිතුවක්කාර අයුරින් ඉහළ අධිකරණ විනිසුරුවන්ගේ ධුර කාලය දීර්ඝ කිරීමට උත්සාහ දරමින් නීතියේ ආධිපත්‍ය බිඳදැමීමට එරෙහිව සමස්ථ ප්‍රජාතන්ත්‍රවාදය අගයන පක්ෂවල නැගී සිටීමේ අවශ්‍යතාව.

ආණ්ඩුව මේ වනවිට කිසිදු පිළිගත හැකි සාධාරණ හේතුවකින් තොරව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීමට උත්සහ දරණ බව අපගේ විශ්වාසයයි. මෙම ක්‍රියාව නීතියේ ආධිපත්‍යයට දැඩි බලපෑමක් ඇති කළ හැකි තත්වයක් වන අතරම එමගින් අප මවුබිමේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයට දැඩි බලපෑමක් එල්ල කිරීමට උත්සාහ දරන බව පෙනී යයි.

දැනටමත් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමය, ආසියාතු නීතිඥ සංගමය හා පොදුරාජ්‍ය මණ්ඩලීය නීතිඥ සංගමය සිය අප්‍රසාදය සහ/හෝ විරෝධය පළකර ඇති තත්වයක් යටතේ ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍ය මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියලු පක්ෂ එකමුතුව මෙයට දැඩි ලෙස විරෝධය පළකිරීම කළ යුතු බව අපි අදහස් කරමු.

මේ අනුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකවරයා වශයෙන් සියලු ප්‍රජාතන්ත්‍රවාදය අගයන පක්ෂ මෙම පත්ව ඇති බැරෑරුම් තත්ත්වය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා කැඳවීමක් කරන මෙන් මෙයින් ඔබතුමන්ගෙන් ඉල්ලා සිටිමි.

තවද මේ සඳහා මේ වනතෙක් පාර්ලිමේන්තුව නියෝජනය කල සියලු දේශපාලන පක්ෂවල නායකවරුන් හා අනෙකුත් සුදුසු යැයි හැගෙන දේශපාලන පක්ෂ නායකයන් කැඳවීම සුදුසු බව අපගේ විශ්වාසයයි. මෙම වැදගත් කරුණ සම්බන්ධයෙන් ඔබතුමන්ගේ ඉක්මන් අවධානය යොමු වනු ඇතැයි අපේක්ෂා කරමි.

ස්තුතියි.
මෙයට - විශ්වාසී,
නාමල් රාජපක්ෂ (පා.ම)
ජාතික සංවිධායක

කපිල පුංචිමාන්නගේ

කොළඹ 05, කිරුළපන, ජයරත්න මාවත, අංක 22හි පිහිටි ශ්‍රී මීඩියා ඉන්ටර්නැෂනල් නෙට්වර්ක් පුද්ගලික සමාගම විසින්, මහරගම හිවාග සංස්කරණ පාර, අංක 102/17හි පිහිටි සදුර් ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් පුද්ගලික සමාගම් ආයතනයේදී 2026 ජූලි 12 වැනි ඉරිදා මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.